## අන්තර්ගතය


| | | පිටුව |
|---|---|---|
| **1** කොටස | දැක්ම පිළිබඳ ප්‍රකාශය | 01 |
| **2** කොටස | මෙහෙවර පිළිබඳ ප්‍රකාශය | 01 |
| **3** කොටස | සංස්ථාපිත ඉලක්ක | 01 |
| **4** කොටස | පාලක සභාව | 02-04 |
| **5** කොටස | උප කුලපතිවරයාගේ සමාලෝචනය | 05-17 |
| **6** කොටස | සම්පත් සහ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 18 |
| **7** කොටස | දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 19-25 |
| **8** කොටස | විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර (ශිෂ්‍යත්වලාභීන් ඇතුළුව) | 26 |
| **9** කොටස | අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර | 27 |
| **10** කොටස | අනධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර | 28-29 |
| **11** කොටස | අවසන් කළ පර්යේෂණ ව්‍යාපෘති/ පේටන්ට් බලපත්‍ර | 30 |
| **12** කොටස | පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 31 |

| | | |
|---|---|---|
| **13 කොටස** | වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 32 |
| **14 කොටස** | ලද තිළිණ පිළිබඳ විස්තර | 33 |
| **15 කොටස** | ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර | 33 |
| **16 කොටස** | පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 34 |
| **17 කොටස** | ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | 34 |
| **18 කොටස** | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශිය/ විදේශීය අරමුදල් සම්පාදිත) | 35-36 |
| **19 කොටස** | ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශිය/ විදේශිය අරමුදල් සම්පාදිත) | 37-38 |
| **20 කොටස** | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම) | 39 |
| **21 කොටස** | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) | 39 |
| **22 කොටස** | මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය | 40 |
| **23 කොටස** | යටිතල පහසුකම් පිළිබඳ විස්තර | 41 |
| **24 කොටස** | **මූල්‍ය ගිණුම 2012** | |

| | | |
|---|---|---|
| 24.1 | 2012.12.31 වන දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 42 |
| 24.2 | 2012.12.31 වන දිනට මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය | 43 |
| 24.3 | 2012.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 44 |
| 24.4 | 2012.12.31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 45 |
| 24.5 | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන් | 46-50 |
| 24.6 | මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන් | 51-53 |
| 24.7 | විගණනකාධිපතිගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් | 54-75 |
| 24.8 | ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්යසාධනය – 2012 | 76 |

## 1. දැක්ම පිළිබඳ ප්‍රකාශය

වඩාත්ම ගෝලීයව පිළිගත් ආසියාවෙහි දැනුම් ව්‍යවසාය වීම.

## 2. මෙහෙවර පිළිබඳ ප්‍රකාශය

- අභියෝගයන්ගේ විවිධත්වයක් සඳහා විමසුම් මනස සහ කුසලතා සංවර්ධනය පෝෂණය කරන ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීමෙන්;
- දැනුම පිළිබඳ සීමා මායිම් ව්‍යාප්ත කිරීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කරගෙන යාමෙන්;
- ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සහ තාක්ෂණ හුවමාරුවට පහසුකම් සැලසීමෙන්;
- අන්තර්ජාතිකව ස්ථානගත වූ ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ
- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීමෙන්;

ආසියාවෙහි තාක්ෂණික සහ ආශ්‍රිත ශික්ෂණයන්හි ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය වීම.

## 3. සංස්ථාපිත ඉලක්ක

1 වන ඉලක්කය: උසස් ඉගෙනුමෙහි විශිෂ්ඨතාවයේ මධ්‍යස්ථානයක් ලෙස අන්තර්ජාතික පිළිගැනීම මුදුන් පමුණුවා ගැනීම.

2 වන ඉලක්කය: ජාතික අදාළකත්වය සහ අන්තර්ජාතික පිළිගැනීම සමග පර්යේෂණ, නවෝත්පාදන සහ නිර්මාණශීලීත්වය තුළ විශිෂ්ඨත්වය මුදුන්පමුණුවා ගැනීම.

3 වන ඉලක්කය: ජාතික අවශ්‍යතාවය සහ කර්මාන්තයේ අභිමතාර්ථ වලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යාපනය සපයන ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් වීම.

4 වන ඉලක්කය: එහි ක්‍රියාකාරකම් තුළ විශිෂ්ඨත්වය මුදුන් පමුණුවා ගැනීමට බුද්ධිමය, භෞතික සහ සමාජ පරිසරයක් නිර්මාණය කිරීම.

5 වන ඉලක්කය: මනාව උගත් ප්‍රජාවක්, දීප්තිමත් විශ්වවිද්‍යාලයක සහ වෙනස්වන සමාජයක අභියෝග වලට මුහුණ දීමට ලොල් වූ ආකල්ප ඇති නිපුණ සහ තෘප්තිමත් කාර්ය මණ්ඩලයක් සහ ශිෂ්‍යයන් බිහි කිරීම.

6 වන ඉලක්කය: උසස් තාක්ෂණ සහ වෙනත් උපදේශන සේවාවන්හි ප්‍රමුඛ උපදේශක සහ සැපයුම්කරු බවට පත් වීම.

7 වන ඉලක්කය: ශ්‍රී ලංකාවේ සියලු අදාළ ශික්ෂණයන් සහ උසස්/වෘත්තීය අධ්‍යාපනය තුළ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ජාතික සංවර්ධනයේ දී රජයට උපදේශකයෙකු වීම.

8 වන ඉලක්කය: තත්ව පාලනය සහ කාර්යක්ෂම සංස්ථාපිත පාලනයක් සඳහා යාන්ත්‍රණයක් ආයතනගත කිරීම.

## 4. පාලක සභාව

**නිලබලයෙන් සාමාජිකත්වය දරන සාමාජිකයන්:**

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | මහාචාර්ය ඒ.කේ.ඩබ්ලිව් ජයවර්ධන |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය ආර්.ඒ. අතලගේ |
| පීඨාධිපති, වාස්තුවිද්‍යා පීඨය | මහාචාර්ය පී.කේ.එස්. මහානාම |
| පීඨාධිපති, ඉංජිනේරු පීඨය | මහාචාර්ය යූ.ජී.ඒ. පුස්වැවල |
| පීඨාධිපති, තොරතුරු තාක්ෂණ පීඨය | මහාචාර්ය ඒ.එස්. කරුණානන්ද (2012.11.30 දක්වා) |
| | ඩී.කේ. විතානගේ මහතා (2012.12.01 සිට) |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයන්:**

(i) කේ.යූ. පුෂ්පකුමාර මහතා
මහජන බැංකුවේ හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ක්‍රමෝපාය සැලසුම්/ පර්යේෂණ අධ්‍යක්ෂ) සහ වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී වන අතර වසර 35 ක අත්දැකීම් සහිත වෘත්තීය බැංකු නිලධාරියෙක් වේ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ගණිතය අංශයේ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිධාරී එම මහතාට කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ද ඇත. ඔහු රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලියාපදිංචි උපදේශකයෙක් ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (අලෙවි කළමනාකරණ) ප්‍රධාන පරීක්ෂකවරයෙක් ද එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ආයතනයේ සාමාජිකයෙක් ද වේ. ඔහු 2008 වසරේ සිට මොරටුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙක් ලෙස සේවය කරයි. වර්තමානය වන විට පුෂ්පකුමාර මහතා බැංකු කටයුතු හා ව්‍යාපාර/ කළමනාකරණ ක්‍රමෝපායවේදියෙක් ලෙස සිය වෘත්තීය කටයුතුවල නියැලේ.

(ii) මහාචාර්ය එන්. ද සිල්වා මහත්මිය
කැළණිය විශ්ව විද්‍යාලයේ පවුල් වෛද්‍ය පිළිබඳ එමිරටස් මහාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපති, පශ්චාත් වෛද්‍ය ආයතනයේ පවුල් වෛද්‍ය පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ හිටපු සභාපතිනිය, සහ ශ්‍රී ලංකා සාමාන්‍ය වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලයේ හිටපු සභාපතිනිය. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා උපාධිධාරිනියක වන ඇයට ළමා සෞඛ්‍යය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පවුල් ඖෂධ පිළිබඳ පශ්චාත් උපාධියක් සහ උසස් වෛද්‍ය උපාධියක් ද හිමිය. කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩලයෙන් සහතිකලත් පවුල් සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක් ද වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බාහිර විභාග පිළිබඳ ස්ථාවර කාරක සභාවේ සාමාජිකාවක් ද වන ඇය මොරටුව විශ්වවිද්‍යාලයේ විවෘත සහ දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ මණ්ඩලයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශයලත් සාමාජිකාවක්ද වේ. මහාචාර්ය ද සිල්වා මහත්මිය 2011 ජූලි මස 01 වනදින සිට මොරටුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකාවක් ලෙස සේවය කරන්නීය.

(iii) මේජර් ජෙනරාල් එම් පීරිස්
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වර්තමාන උපකුලපතිවරයා සහ යාන්ත්‍රික පාබල හමුදාවේ කර්නල් ආඥාපතිවරයා ද වන එම මහතා 1980 සිට ශ්‍රී ලංකා යුධ හමුදාවේ සේවය කරන අතර ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි ශ්‍රී ලංකාව සඳහා වූ ආරක්ෂක, යුධ හමුදා, නාවික සහ ගුවන් හමුදා ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයේ මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස ජ්‍යෙෂ්ඨ තනතුරු කිහිපයක්ම දරා ඇත. මැඩ්‍රාස් විශ්වවිද්‍යාලයෙන් දර්ශනපති උපාධිය ලබා ඇති ඔහුට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමන ලද කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ඉන්දියාවේ ලාහෝර් විශ්ව විද්‍යාලයෙන් පිරි නමන ලද ජ්‍යෙෂ්ඨතලයේ ආරක්ෂක කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ඇත. ඔහු 2011 ජූලි මස 01 වන දින සිට මොරටුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙක් ලෙස සේවය කරයි.

(iv) ආචාර්ය ආර්.එල්.ඩබ්ලිව්. කොග්ගලගේ

ඉන්ෆොමැටික්ස් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ආයතනයේ ආශ්‍රිත මහාචාර්යවරයෙක් වන ඒ මහතා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ හිටපු (අධ්‍යයන) නියෝජ්‍ය උපකුලපතිවරයා ද වේ. මොරටුව විශ්වවිද්‍යාලයෙන් ලැබූ පරිගණක විද්‍යාව සහ ඉංජිනේරු ශිල්පය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ද සිංගප්පූරුවේ එන්යූඑස් විශ්වවිද්‍යාලය පිරිනැමූ විද්‍යාපති උපාධියක් ද ඇත. එමෙන්ම ඕස්ට්‍රේලියාවේ මෙල්බෝන් විශ්ව විද්‍යාලයෙන් ලැබූ යාන්ත්‍රික ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ශිල්පය පිළිබඳ දර්ශනශූරී උපාධියක් හිමිය. ආචාර්ය කොග්ගලගේ 2011 ජුලි මස 01 වන දින සිට මොරටුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙක් ලෙස සේවය කරයි. එමෙන්ම ඔහු මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙක් ද වේ.

(v) ජේ. කුරුකුලසූරිය මහතා

වර්ෂ 1984 දී මොරටුව විශ්වවිද්‍යාලයෙන් පිරි නමන ලද සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් හිමි එම මහතාට නෝර්වේ, ත්‍රොන්ඩ්හිම් විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද වරාය හා වෙරළබඩ ඉංජිනේරු ශිල්පය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද (ආර්ථික විද්‍යාව පිළිබඳ) ශාස්ත්‍රපති උපාධියක් ද සතුය. මුල් අවස්ථාවේ දී මහවැලි අධිකාරියේ වාරිමාර්ග ඉංජිනේරුවෙක් ලෙස සේවය කිරීම ආරම්භ කරන ලද අතර ඉන්පසුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවයට සම්බන්ධ විය. දැනට එම මහතා එම ආයතනයේම අතිරේක කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරයි. කොළඹ, ඔලුවිල්, සහ හම්බන්තොට වරායවල සිදු කළ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා එම මහතා සම්බන්ධ විය. ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙක් වන එම මහතා 2010 වසරේ දී නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරන ලදී. ඉන්පසුව එම මහතාට රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ (නාගරික සංවර්ධනය පිළිබඳ) අතිරේක ලේකම්වරයෙක් ලෙසට සේවා උසස්වීමක් හිමි විය.

(vi) බී.එච්.එම්. රත්නසිරි මහතා

ව්‍යාපාර සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයෙක්, නාගරික සංවර්ධනය හා ජල සම්පාදන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙක්, සමාජ සංවර්ධනය පිළිබඳ ජාතික ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ (පරිපාලන) අධ්‍යක්ෂවරයා, ශ්‍රී ලංකා ප්‍රවාහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (පරිපාලන හා මුදල් පිළිබඳ) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා, ජාතික තරුණ සේවා සභාවේ (පරිපාලන හා මුදල් පිළිබඳ) අධ්‍යක්ෂවරයා, තරුණ කටයුතු අමාත්‍යාංශයේ (සුළු ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, බදුල්ල සහ නුවර එළිය යන දිස්ත්‍රික්කවල සහකාර දිසාපතිවරයා ලෙස ද සේවය කර ඇති එම මහතා, වර්තමානයේ දී ශ්‍රී ලංකා මහාබෝධි සංගමයේ ගරු ලේකම්වරයා ලෙස ද ආපදා කළමනාකරණ අමාත්‍යාශයේ උපදේශකවරයෙක්, සහ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙක් ලෙස ද සේවය කරයි. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (විශේෂ ශ්‍රේණියේ) ධූරයක් දරන එම මහතාට ව්‍යාපාර පරිපාලනවේදී (ඔස්ට්‍රේලියාව) උපාධියක් ද (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද) (ව්‍යාපාර පරිපාලනය පිළිබඳ) විද්‍යාවේදී උපාධියක් ද හිමිය. රත්නසිරි මහතා 2011 ජුලි මස 01 වන දින සිට මොරටුව විශ්ව විද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකයෙක් ලෙස සේවය කරයි.

(vii) කේ. ඉද්දමල්ගොඩ මහත්මිය

දෙහිවල, අත්තිඩියේ පිහිටි කුවාලි ගුරු විද්‍යාලයේ අධ්‍යක්ෂිකාව වන කුමුදිනී ඉද්දමල්ගොඩ මහත්මිය ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක්ද වේ. අන්තර්ජාතික පාසැල් ජාලයේ ශාස්ත්‍රීය

උපදේශකවරියක් වන එතුමිය දක්ෂ රචකයෙක් ද ගුරු පුහුණුව පිළිබඳ ජාතික වෘත්තීය සුදුසුකම සැපයීම සඳහා ඇගයීම්කරුවෙක් ලෙස ද කටයුතු කරයි. සමාජ විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් හිමි එතුමියට ජනමාධ්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද කැළණිය විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද ජනමාධ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද හිමිය. එතුමිය ග්‍රන්ථ කිහිපයක ද කතෘ වේ. එනම් සාමූහික සංචලනයේ ඵලදායීත්වය සහ ව්‍යාප්තිය, වසන්ත මාරුතය, අපි අපේ අමුත්තන්ට සලකමු, පෙර පාසැල් අධ්‍යාපනය පිළිබඳ ගුරුපොත, ස්මෝල් වොන්ඩර්ස් I සහ II, මාධ්‍ය යොමුව සහ 2010 වසරේ ජනාධිපතිවරණ ඡන්දය පිළිබඳ ඇගයීමක් යනාදිය ඇගේ ප්‍රකාශන අතර වේ. ගුරු පුහුණුකරුවෙක් වන එතුමිය අධ්‍යාපනික රචකයෙක් ද මාධ්‍යවේදිනියක් ද වේ. කුමුදිනී ඉද්දමල්ගොඩ මහත්මිය 2011 ජුලි මස 01 වන දින සිට මොරටුව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ සාමාජිකාවක් ලෙස සේවය කරයි.

(viii) ශ්‍රේෂියන් ඒ පීරිස් මහතා (2012.05.02 දක්වා)

වරලත් කාර්මික ඉංජිනේරුවෙක් සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයෙක් ද වන එතුමා ඔහුගේ වසර 34 ක ඉංජිනේරු ශිල්පය, ඉදිකිරීම්, ගණකාධිකරණය, සංවර්ධන බැංකුකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, දරිද්‍රතාව දුරලීම, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය, ව්‍යාපාර ප්‍රවර්ධනය, ව්‍යාපෘති සැකසීම හා ක්‍රියාත්මක කිරීම, සංස්ථා හා ව්‍යාපාර සැලසුම්කරණය හා කළමනාකරණය, හැකියාවන් ගොඩනැගීම හා පුහුණුව ආදී බහු-විෂය, බහු-පාර්ශ්වික වෘත්තීය දිවිය තුළ රටවල් හතක ව්‍යාපාර හා ප්‍රජාව තුළ ධනාත්මක අගයක් එක් කිරීමට දායක වී ඇත. මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක් වන පීරිස් මහතා ගැඹුරු චින්තකයෙක් ද තියුණු විචේචකයෙක් ද කවියෙක් සහ කළමනාකරණය පිළිබඳ අද්විතීය දැනුමක් ඇති නායකයෙක් ද වේ. බුන්වත්භාවය හේතුවෙන් කඩාවැටීම ආසන්නව තිබූ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නැවත ගොඩනැගීම ඔහුගේ වෘත්තිය තුළ කැපී පෙනෙන අවස්ථාවක් වේ.

(ix) ජී.කේ. අමරතුංග මහතා (2012.05.30 සිට)

මධ්‍යම පරිසර අධිකාරියේ හිටපු සභාපතිවරයා, නියෝජ්‍ය සර්වෙයර් ජනරාල්වරයා, (වර්තමානයේ ආයෝජන මණ්ඩලය වන) මහ කොළඹ ආර්ථික කොමිෂමේ කලාපීය සැලසුම්කරණය හා සංවර්ධනය පිළිබඳ අධ්‍යක්ෂවරයා, රාජ්‍ය මැණික් සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ හා සංචාරක අමාත්‍යාංශයේ උපදේශකවරයෙක් ද (ජාතික සංවර්ධන බැංකුවේ පරිපාලිත ආයතනයක් වන) සීමාසහිත පාරිසරික සම්පත් කළමනාකරණ (පෞද්) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා ද වේ. ඔහු SLAAS ආයතනය, පාරිසරික වෘත්තීය සමාගම, සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි වායු හා අපද්‍රව්‍ය කළමනාකරණ සංගමය යන ආයතනවල සාමාජිකයෙක් ද වේ. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද භූගෝල විද්‍යාව පිළිබඳ (ගෞරව) ශාස්ත්‍රවේදී උපාධියක් හිමි අමරතුංග මහතා ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් පිරිනමන ලද මැනුම් කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද සතු වන අතර නිව්යෝක්වල පිහිටි කොලොම්බියා විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපාය සැලසුම්කරණ පාඨමාලාවක් ද හදාරා ඇත.

**සනාතන සභාව විසින් තෝරාගත් සාමාජිකයන්:** මහාචාර්ය ජේ.ආර්. ලූකස්
මහාචාර්ය එම්.එස්. මානවඩු

**ලේඛකාධිකාරි (ලේකම්):** ඒ.එල්. ජවුෆර් සදීක් මහතා

**මූල්‍යාධිකාරි (ආරාධනය මත):** පී.ඒ. ගුණතිලක - වැඩබලන මූල්‍යාධිකාරි (2012.09.30 දක්වා)
- මූල්‍යාධිකාරි (2012.10.01 සිට)

## 5. උපකුලපතිතුමාගේ සමාලෝචනය

1960 දී කටුබැද්දේ පිහිටුවන ලද ප්‍රායෝගික තාක්ෂණ ආයතනයට සහ 1966 දී පිහිටුවන ලද ලංකා තාක්ෂණ විද්‍යාලයට පසුව පිහිටුවන ලද මොරටුව විශ්වවිද්‍යාලය 1972 පෙබරවාරි මස 15 වන දින කටුබැද්ද මණ්ඩපයේ දී කටයුතු ආරම්භ කරන ලදී.

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපය එහි වර්තමාන සංස්ථාගත නම වන "මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව" යන්න සහිතව ස්වාධීන විශ්වවිද්‍යාලයක තත්ත්වය හිමි කර ගන්නා ලදී. වර්තමානය වන විට මොරටුව විශ්වවිද්‍යාලය තුළ වාස්තු විද්‍යා, ඉංජිනේරු සහ තොරතුරු තාක්ෂණ ලෙස පීඨ තුනක් ද විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා ගන්නා ශිෂ්‍යයන්ට ප්‍රථම උපාධි පිරිනමන වැඩසටහන් 11 ක් ක්‍රියාත්මක කරන අධ්‍යයන දෙපාර්තමේන්තු දහනවයක් (19) ක් ද (1 වන වගුව බලන්න), පශ්චාත් උපාධි වැඩසටහන් පනස් හයක් (56) ක් ද ඇත.

**1වන වගුව - මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ හා දෙපාර්තමේන්තු**

| **ඉංජිනේරු පීඨය** | **වාස්තු විද්‍යා පීඨය** |
|---|---|
| රසායනික හා පිරිසැකසුම් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | වාස්තුවිද්‍යා දෙපාර්තමේන්තුව |
| සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | නගර හා ග්‍රාම නිර්මාණකරණ දෙපාර්තමේන්තුව |
| පරිගණක විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව | ගොඩනැගිලි ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව |
| භූ සම්පත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | අනුකලිත සැලසුම් දෙපාර්තමේන්තුව |
| විදුලි ඉංජිනේරු දෙපාර්තමේන්තුව | |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු දෙපාර්තමේන්තුව | **තොරතුරු තාක්ෂණ පීඨය** |
| තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව | තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව |
| භෞතික විද්‍යා හා ඉංජිනේරු දෙපාර්තමේන්තුව | පරිගණන ගණිත ශාස්ත්‍ර දෙපාර්තමේන්තුව |
| කාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව | අන්තර්ශික්ෂණ අධ්‍යයන දෙපාර්තමේන්තුව |
| ගණිත ශාස්ත්‍ර දෙපාර්තමේන්තුව | |
| ඇඟලුම් සහ රෙදිපිළි තාක්ෂණ දෙපාර්තමේන්තුව | |
| ප්‍රවාහන හා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව | |

මොරටුව විශ්වවිද්‍යාලය, අද වන විට අවිවාදාත්මකවම, ශ්‍රී ලංකාවේ **සමස්තයක් ලෙස හොඳම** විශ්වවිද්‍යාලය වේ. මොරටුව විශ්වවිද්‍යාලයේ කෙටිකාලීන මෙහෙවර වන්නේ "ලෝකයේ ඉතාම උසස් සහ කීර්තිමත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධි වැඩසටහනක් සඳහා පසුවෙන් ඇතුළත් විය හැකි හා අධ්‍යාපනය ලද හැකි මෙන්ම අන්තර්ජාතිකව කීර්තිමත් උසස් විශ්වවිද්‍යාලවලින් බිහිවූ උපාධිධාරීන් මෙන්ම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු කරන තාක්ෂණ ක්ෂේත්‍රවල ඉතාම උසස් උපාධිධාරීන් බිහි කිරීම" ය. අපගේ ශිෂ්‍යයන්ට සහ කාර්යමණ්ඩලයට අගනා ප්‍රතිඵල ගෙන අත්දැකීම් පිරිනමන පරිසරයක් තුළ මෙම මෙහෙවර ඉටු කර ගැනීමට අපේක්ෂිත අතර ඒ අනුව ජාතික වශයෙන් ආදාළ වන්නා වූ ද අන්තර්ජාතික වශයෙන් කීර්තියක් දිනා ගත්තා වූ ද විශ්වවිද්‍යාලයක් බවට පත් වීමට බලාපොරොත්තු වේ.

ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ සමස්ත ඉලක්කය වන්නේ අධ්‍යාපනික අතින් ඉතා සාර්ථක, ආත්ම විශ්වාසයෙන් යුත්, නම්‍යශීලී, ඉතා ඉක්මනින් රැකියාවක නිරත විය හැකි, අන්තර්ජාතික වශයෙන් ගුණාත්මක තත්වයේ සිටින, පළමු දිනයේ සිට රැකියාවක නිරතවීමට සමත් උපාධිධාරීන් බිහි කිරීම සහ අපේ ශිෂ්‍යයන් හුදෙක් උපාධියට "රැකියා සොයන්නන්" නොව "රැකියා මවන්නන්" බවට පත්වීමට පුහුණු කිරීමයි. අපගේ බොහොමයක් නව උපාධිධාරීන්ගේ වාර්ෂික වැටුපටත් වඩා අඩු මුදලක් වන එක් ශිෂ්‍යයෙක් සඳහා වන පිරිවැය වන **ඇමෙරිකානු ඩොලර් 6000 ක පමණ පිරිවැයක්** මගින් ඉංජිනේරු ශිල්පය, වාස්තු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, සැලසුම්කරණය, නගර හා ග්‍රාම නිර්මාණකරණය, පහසුකම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ප්‍රවාහනය හා පහසුකම් කළමනාකරණය ආදී අංශවල රැකියාවේ නිරත විය හැකි, ගෝලීය වශයෙන් ඉතා උසස් ගුණාත්මක උපාධිධාරීන් මොරටුව විශ්වවිද්‍යාලය මගින් බිහි කරන බව වැඩි දෙනෙක් විසින් හඳුනා නොගත් කරුණකි.

මෙම පසුබිම මත සලකා බැලීමේ දී 2012 වසර තුළ මොරටුව විශ්වවිද්‍යාලය දිනා ගත් ජයග්‍රහණ සහ විශ්වවිද්‍යාලය කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් ක්‍රියාකාරකම්වලින් දිනා ගත් ජයග්‍රහණ

පිළිබඳව මෙම සමාලෝචනය තුළින් සාකච්ඡා කිරීමට අපේක්ෂිතය. ඉන්අනතුරුව සංස්ථාපිත සැලැස්මේ අංශ, ශ්‍රී ලංකා රජය කර ඇති ප්‍රාග්ධන ආයෝජනය සහ විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියා ආදිය සලකා බලනු ලැබේ. විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපාය සංවර්ධනයට බාධාවක් වන සංරෝධක පිළිබඳ කෙටි ප්‍රකාශයක් සමඟ සමාලෝචනය අවසන් වනු ඇත.

## 5.1 විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ඇති පුළුල් ප්‍රවේශය

2000 වසරේ දී මොරටුව විශ්වවිද්‍යාලය මඟින් ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) වැඩසටහන පිරිනැමීම සඳහා මොරටුව විශවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) එම විශ්වවිද්‍යාලයෙන් වෙන්ව පිහිටුවන ලදී. එම අවස්ථාවේ දී විශ්වවිද්‍යාලය තුළ ඉංජිනේරු සහ වාස්තු විද්‍යා ලෙස පීඨ දෙකක් තිබූ අතර උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 2300 ක් විය. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව සඳහා ශිෂ්‍යයන් 1050 ක් සහභාගී වූහ. ඉංජිනේරු පීඨය විෂය ක්ෂේත්‍ර නවයක් සම්බන්ධව එක් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් පිරිනමන ලද අතර වාස්තු විද්‍යා පීඨය පරිසරය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලෙස උපාධි දෙකක් පිරිනමන ලදී.

2012 වසර වන විට මොරටුව විශ්වවිද්‍යාලය තුළ පීඨ තුනක් තිබූ අතර උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සංඛ්‍යාව 4954ක් ද මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ අධ්‍යාපනය හැදෑරූ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා අපේක්ෂකයන් 1050 ක් ද එකම පරිශ්‍රයක් තුළ වූහ. ඉංජිනේරු පීඨය විසින් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය, ප්‍රවාහනය හා පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ මෝස්තර නිර්මාණය හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලෙස උපාධි වර්ග තුනක් පිරිනමනු ලැබේ. මේ සියලු උපාධි වසර හතරක ගෞරව උපාධි වේ. වාස්තු විද්‍යා පීඨය වාස්තුවිද්‍යා, සැලසුම්කරණය, ප්‍රමාණ සමීක්ෂණය, පහසුකම් කළමනාකරණය, නගර හා ග්‍රාම නිර්මාණය සහ 2012 වසරේ දී හඳුන්වා දුන් භූදර්ශන වාස්තුවිද්‍යාව යනාදී විද්‍යාවේදී උපාධි වැඩසටහන් හයක් පිරිනමයි. එමෙන්ම තොරතුරු තාක්ෂණ පීඨය ද තොරතුරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය සහ තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ගෞරව උපාධිය ලෙස උපාධි වැඩටහන් දෙකක් පිරිනමයි. මෙය අමතරව, තොරතුරු තාක්ෂණ පීඨය මඟින් හවුල්කාරත්ව ආයතනවල සහාය ද ඇතිව තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධි වැඩසටහනක් ද බාහිරව සපයන්නා වූ වැඩසටහනක් ලෙස පිරිනමයි. තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය 2011 වසරේ දී ආරම්භ කරන ලද නව වැඩසටහනකි. කෙසේවුවද, 2012 වසරේ දී උද්ගත වූ Z ලකුණ පිළිබඳ ගැටළුව, අභියෝගතා පරීක්ෂණයේ ගැටළු සහ කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංගම් ක්‍රියාමාර්ග ආදිය හේතුවෙන් 2012 වසරේ ශිෂ්‍ය බඳවා ගැනීම සිදු කළ නොහැකි වූ අතර එම බඳවා ගැනීම සිදු කළ හැකි වූයේ 2013 වසරේ මාර්තු මාසයේ දීය. 2013 මාර්තු මස විශ්වවිද්‍යාලයට සිසුන් 1644 ක් බඳවා ගන්නා ලදී.

අපගේ උපාධි වැඩසටහන් හතර සම්බන්ධව ශිෂ්‍යයන් සහ ඔවුන්ගේ දෙමාපියන්ගේ වර්ධනය වන ඉහළ ඉල්ලුම සපුරාලනු වස් ගත වූ වසර දහයක කාලය තුළ වාර්ෂිකව බඳවාගන්නා උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව සමස්තයක් ලෙස 85% කින් ද තොරතුරු තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම 700% කින් ද ඉහළ දමා ඇති බව මෙහි දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණකි. පීඨ තුන සඳහා පසුගිය වසර දහයක කාලය තුළ සිදු කළ ශිෂ්‍ය බඳවා ගැනීම් රටාව 1 වන රූපසටහන මඟින් පෙන්නුම් කරයි.

## 5.2 ජයග්‍රහණ හා පිළිගැනීම්

පසුගිය වරස දහයක කාලය තුළ ඉහළ ගිය වාර්ෂික බඳවා ගැනීම් සහ සීමිත පහසුකම් සමඟ මොරටුව විශ්වවිද්‍යාලය විසින් එහි සියලු උපාධිධාරීන්ගේ අදාළත්වය හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට සමත්වී ඇත. 2012 වසරේ සිදු කළ සමීක්ෂණයට අනුව උපාධිධාරීන් රැකියාගතවීමේ රටාව අනුව බලන විට, උපාධි ප්‍රදානෝත්සවය වන අවස්ථාවේ දී සියලු උපාධිධාරීන්ගෙන් 97.6% ක් ද ඉංජිනේරු උපාධිධාරීන්ගෙන් 98.8% ක් ද තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්ගෙන් 100% ක් ද රැකියාවල නිරත වූ බවට වාර්තා වන අතර මොරටුව විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන් සම්බන්ධව කර්මාන්තය හා එහි සේවායෝජකයන්අතර විශාල ඉල්ලුමක්

ඇති බවට ඒ අනුව පෙනීයයි. මොරටුව විශ්වවිද්‍යාලය මඟින් පවත් වනු ලැබූ එක් එක් ප්‍රථම උපාධි වැඩසටහන්වල රැකියාගත කිරීමේ අනුපාතික 2 වන රූපසටහන මඟින් පෙන්නුම් කරයි.

2012 වසරේ දී අවසන් විභාගයට පෙනී සිටි 1116 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතුරින් සිසුන් 994 ක් (89% ක්) සිය පළමු උපාධිය හිමිකර ගැනීම සඳහා දක්වන ලද අවම කාල පරිච්ඡේදය තුළ උපාධිය හිමි කර ගත්හ. 2012 වසරේ දී පවත් වන ලද පොදු උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනමන ලද පශ්චාත් උපාධි ඇතුළු, මුළු උපාධි සංඛ්‍යාව 1452 ක් වූ අතර එයින් උපාධි 1096 ක් ප්‍රථම උපාධි වූ අතර 356 ක් පශ්චාත් උපාධි විය. 2011 වසරට සාපේක්ෂව 2012 වසරේ දී පවත් වන ලද උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනමන ලද පශ්චාත් උපාධි සංඛ්‍යාවේ 36% ක පමණ වර්ධනයක් දක්නට ලැබෙන අතර ඒ අනුව බලන කළ මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රථම උපාධි මට්ටමේ අවස්ථාවන් පමණක් නොව උසස් උපාධි, පර්යේෂණ, දැනුම් නිර්මාණය හා උසස් දැනුම ව්‍යාප්තිය අතින් ද ඉහළ මට්ටමකට ළඟා වන බව පෙන්නුම් කරයි.




1 වන රූපසටහන - පසු ගිය වසර දහයක කාලය තුළ පීඨ සඳහා වාර්ෂික බඳවා ගැනීම්




2 වන රූපසටහන - විවිධ පාඨමාලාවල සේවා නියුක්ති හැකියා අනුපාතික

මොරටුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සිය කාර්යසාධනය හරහා ලොව පුරා ක්ෂේත්‍ර රාශියකින් ලබා ගෙන ඇති පිළිගැනීම් අනුව ද 2012 වසරේ දී එම විශ්වවිද්‍යාලයේ විශිෂ්ටත්වය අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට සමත් වී ඇත.

ශිෂ්‍යයන්ගේ දක්ෂතාව, නිර්මාණාත්මක හැකියාව සහ කාර්යසාධනය මැනීමේ ලොව පුරා ප්‍රචලිත පිළිගත් තරඟයක් වන ගූගල් සමර් ඔෆ් කෝඩ් (**Google Summer of Code (GSoC)** තරඟයේ දී මොරටුව විශ්වවිද්‍යාලය සිය ආධිපත්‍යය අඛණ්ඩව පවත්වා ගැනීමට සමත් විය. සම්මාන 29 ක් සමඟ මොරටුව විශ්වවිද්‍යාලය 2012 වසරේ වැඩිම සම්මාන දිනාගත් තරඟකරු බවට පත් විය. එමෙන්ම 2007 වසරේ සිට අද දක්වා පැවැත් වූ වාර්ෂික තරඟවල දී (එනම් 2007, 2008, 2009, 2010, 2011 හා 2012) මොරටුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් ඉහළම සම්මාන සංඛ්‍යාවක් දිනාගෙන ඇත. දෙවන ස්ථානය දිනාගත් විශ්වවිද්‍යාලයට හිමි වූ සම්මාන සංඛ්‍යාව මෙන් දෙගුණයකට වඩා දිනාගෙන 2005 වසරේ සිට 2012 වසර දක්වා මුළු සම්මාන 164 ක් දිනා ගත් මොරටුව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන් ශ්‍රී ලංකාව වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 500,000 (රු. මිලියන 50) කට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් උපයා ගැනිමට සමත් වී ඇත.

2012 දී, ඇමෙරිකා එක්සත් ජනපදයේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ආයතනය (IEEE) විසින් සංවිධානය කරනු ලබන ලොව වඩාත්ම අත්‍යන්ත ක්‍රමලේඛ තරඟය ලෙස සලකන IEEEXtreme ග්ලෝබල් ප්‍රෝග්‍රැමින් තරඟයට සහභාගී වූ මොරටුව විශ්වවිද්‍යාලයේ කණ්ඩායම් දෙකක් රටවල් 65 කින් පැමිණ සිටි තරඟකාර කණ්ඩායම් 1500 ක් අතුරින් 2012 වසරේ දී දෙවන ස්ථානය සහ 9 වන ස්ථානය දිනා ගැනීමට සමත් වූහ. දක්ෂතම කණ්ඩායම් 100 අතර මොරටුව විශ්වවිද්‍යාලයේ කණ්ඩායම් 10 ක් තිබූ අතර ලොව වෙනත් කිසිදු විශ්වවිද්‍යාලයකට හෝ අසමසම ලෙස දක්ෂම කණ්ඩායම් 200 අතර කණ්ඩායම් 30 ක්ම ස්ථාන හිමිකර ගැනීමට සමත් වූහ. මෙම ජයග්‍රහණය 2011 වසරේ ලත් ජයග්‍රහණයට බොහෝ සමාන වේ. මෙය 2009 වසරේ දී විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කණ්ඩායමක් ලොව පුරා රටවල් 40 කට වැඩි සංඛ්‍යාවකින් පැමිණි කණ්ඩායම් 721ක් අතුරින් **ජයග්‍රහණය කිරීමේ** සිට ආරම්භ වූ සාර්ථකත්වයේ ඉදිරි පිම්මක් වේ. IEEE ආයතනය නියෝජනය කරන ශිෂ්‍ය ශාඛා තුනක ශිෂ්‍ය කණ්ඩායම් විසින් පැය 24 පුරා අන්තර්ජාලය ඔස්සේ සිදු කරන තරඟයක් වන අතර එම කණ්ඩායම් IEEE ආයතනය ඉදිරිපත් කරන අභියෝගාත්මක ක්‍රමලේඛ ගැටළු මාලාවක් විසඳීම කරනු ලැබේ. ආසියානු-පැසිෆික් IEEE ආයතනයේ රටක් මෙම ගෝලීය තරඟය ජයග්‍රහණය කළ පළමු අවස්ථාව මෙය විය. 2009 වසරේ දී ලැබූ මෙම ජයග්‍රහණය සහ 2010 සහ 2011 වසරවල කාර්යසාධනය අපගේ රටට, මොරටුව විශ්වවිද්‍යාලයට සහ ශ්‍රී ලංකාවේ ක්‍රමලේඛ කර්මාන්තයට විශාල කීර්තියක් හා පිළිගැනීමක් ලබා කර දුන් ඉතා වැදගත් අවස්ථාවන් විය.

එයට අමතරව, මොරටුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය කණ්ඩායම් ලෝක ඇසුරුම් සංවිධානය (World Packaging Organisation) මඟින් සංවිධානය කරන ලද ඇසුරුම් පිළිබඳ ලෝක ශිෂ්‍ය තරුව (World Student Star Packaging) තරඟයේ දී ද ජයග්‍රහණය කර ඇත. එමෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ සහතිකලත් මූල්‍ය විශ්ලේෂක (Certified Financial Analyst) ආයතනයේ දේශීය අංශය මඟින් පවත් වන ලද 2012 ගෝලීය තරඟයක් වන සහතිකලත් මූල්‍ය විශ්ලේෂක ශ්‍රී ලංකා ආයෝජන හා පර්යේෂණ අභියෝගතා තරඟයේ දී ජයග්‍රහණය ලැබීය. මෙම කණ්ඩායම 2013 වසරේ පෙබරවාරි මස මැලේසියාවේ දී පැවැත්වීමට නියමිත ආසියානු පැසිෆික් කලාපීය තරඟයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරනු ඇත.

එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරු රාජකීය ආයතනයේ බාහිර පරීක්ෂකයන් විසින් ප්‍රමාණ සමීක්ෂණ උපාධි වැඩසටහන "ලෝකයේ ප්‍රමාණ සමීක්ෂණය සම්බන්ධව ඇති හොඳම උපාධි වැඩසටහන්වලින් එකක්" ලෙස අඛණ්ඩව දක්වා ඇත. ලොව පුරා කීර්තියක් උසුලන අන්තර්ජාතික ප්‍රතීතන ආයතන තුනක් ඇතුළු වෘත්තීය ආයතන හතරක් මඟින් මෙම වැඩසටහන පිළිගෙන ඇත.

මොරටුව විශ්වවිද්‍යාලයේ ඇති විනයානුකූල අධ්‍යයන ක්‍රියාකාරකම්, කර්මාන්ත ඉලක්කගත පර්යේෂණ හා අන්තර්ක්‍රියා, සහ එහි ජයග්‍රහණයන් හේතුවෙන් කර්මාන්ත නිලධාරීන්, අධ්‍යයන

ප්‍රජාව සහ විශ්වවිද්‍යාල පද්ධතියේ ශිෂ්‍යයන් අතර මොරටුව විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ "හොඳම විශ්වවිද්‍යාලය" බවට ආකල්පයක් නිර්මාණය වී ඇත.

ඉංජිනේරු අධ්‍යයන වැඩසටහන් සඳහා ඇතුළත් වන නව ශිෂ්‍යයන් අතර ද ඇත්තේ මෙවන් ආකල්පයක් බව පෙනේ. මෑත කාලයේ දී ඉංජිනේරු පීඨය සඳහා ඇතුළත් වූ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම සිය පළමු තෝරා ගැනීම ලෙස මොරටුව විශ්වවිද්‍යාලය ඉල්ලා ඇත. සංඛ්‍යාලේඛනවලට අනුව කුසලතා ලැයිස්තුවෙහි සිසුන්ගෙන් දක්ෂම සිසුන් 10% දෙනා අතුරින් 98% කටත් වැඩි පිරිසක් සිය ප්‍රථම උපාධි අධ්‍යයනය සඳහා පළමු තෝරා ගැනීම ලෙස මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය තෝරාගෙන ඇත. උසස් පෙළ විභාගයේ කුසලතා ලැයිස්තුවේ සිටින දක්ෂම ශිෂ්‍යයන් 10% දෙනාට පමණක් සිය කැමැත්ත මත තෝරා ගත් විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අවස්ථාව ලබා දෙන බැවින් මෙය ඉතා විශාල ජයග්‍රහණයකි. Z ලකුණ ප්‍රමාද වීමේ ගැටළුව හේතුවෙන් විශ්වවිද්‍යාලයට බඳවා ගැනීම ප්‍රමාද වුව ද 2012 වසරේ දී ද මෙම නැඹුරුවම අපේක්ෂා කෙරේ.

ඔරු පැදීම, රග්බි, බේස්බෝල්, ක්‍රිකට්, ටයික්වන්ඩෝ, මේස පන්දු, බැඩ්මින්ටන් හා චෙස් ආදී ක්‍රීඩා අංශයෙන් ගත්ත ද මොරටුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් අන්තර් විශ්වවිද්‍යාල තරඟවල දී අතිශය දක්ෂ ලෙස ක්‍රීඩා කර ඇති අතර ඔවුන් ප්‍රථම වරට කාන්තා ටෙනිස් ශූරතාවේ ජයග්‍රාහකයන් වූහ. විශ්වවිද්‍යාලයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව සැලකිල්ලට ගැනීමේ දී මෙම තත්ත්වය විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

තාක්ෂණය හා ආශ්‍රිත විද්‍යා කාණ්ඩය සඳහා වූ වඩාත්ම කැපීපෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයාට හිමි 2012 වසරේ කීර්තිමත් CVCD සම්මානය සහ ලෝක අධ්‍යාපන කොන්ග්‍රසය මඟින් 2012 වසරේ දී ඉන්දියාවේ මුම්බායි නුවර දී ප්‍රදානය කරන ලද අධ්‍යාපනය සඳහා කළ කැපී පෙනෙන දායකත්වය සඳහා වූ සම්මානය සියලුම විශ්ව විද්‍යාල අතුරින් මහාචාර්ය මලික් රණසිංහ හිමි කර ගැනීම කාර්ය මණ්ඩලය විසින් දිනා ගත් සම්මාන පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ඉතා වැදගත් වේ. තවද, මහාචාර්ය පද්මා අමරසිංහ සමඟ එක්ව සම-කර්තෘත්වය දරන ලද "අපජලයෙන් CU සහ PB ඉවත් කිරීම සඳහා වූ අඩු පිරිවැයක් සහිත අවශෝෂකයක් ලෙස තේ අපද්‍රව්‍ය" (Tea waste as a low cost absorbent for the removal of CU and PB from wastewater") යන මාතෘකාවෙන් යුත් ලිපිය 2012 සැප්තැම්බර් මස ISI හි අනිවාර්ය විද්‍යා දර්ශකවල (Essential Science Indicators) වැඩි වශයෙන්ම උපුටාගත් ප්‍රකාශනය විය. පසුගිය වසර දහයක කාලය තුළ සූචිගත කරන ලද ජර්නල් ලිපි සඳහා ලැබූ උපුටා ගැනීම් පාදක කර ගත් ක්ෂේත්‍රයේ වැඩියෙන්ම උපුටා ගන්නා ලද උසස්ම පර්යේෂකයන් අතුරින් 1%ක සංඛ්‍යාව මෙම ලැයිස්තුවේ ඇතුළත්ය.

මොරටුව විශ්වවිද්‍යාලය විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමයේ සිය පළමු බාහිර උපාධි පාඨමාලාව වන තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධි පාඨමාලාව (BIT) 2006 වසරේ දී ආරම්භ කරන ලදී. මොරටුව විශ්වවිද්‍යාලය සඳහා වූ ප්‍රධාන සැලැස්ම මඟින් මෙම විවෘත හා දුරස්ථ අධ්‍යාපන ක්‍රමය උසස් පෙළ සුදුසුකම් ලත් , විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල සිසුන් විශාල සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලය මඟින් පිරි නමන උසස් ගුණාත්මක අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති හැකියාව කැපීපෙනෙන ලෙස ඉහළ දමන්නා වූ ක්‍රමයක් ලෙස හඳුනා ගනී. තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධි පාඨමාලාවේ (BIT) පළමු කණ්ඩායම 2011 වසරේ දී උපාධිය ලබා ගත්හ. විවෘත හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රයේ (CODL) කටයුතු හා පාලනය ගුණාත්මක දියුණුවක් අපේක්ෂාවෙන් 2012 වසරේ විසි එක්වන ශතවර්ෂය සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතිය (HETC) යටතේ ප්‍රදානය කරන ලද රු. මිලියන 20ක ප්‍රදානයත් සමඟ විවෘත හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රයේ ක්‍රියාකාරකම් පුළුල් වනු ඇත.

සියලුම අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පර්යේෂණය අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙසින් ද මොරටුව විශ්වවිද්‍යාලය සලකයි. පර්යේෂණ සඳහා වූ අරමුදල් අන්තර්ජාතික හා දේශීය බාහිර අරමුදල් සපයන නියෝජිතායතන හරහා මෙන්ම විශ්ව විද්‍යාලයේ සනාතන පර්යේෂණ කමිටුව හරහා ද හිමි වේ. 2012 වසරේ දී විශ්වවිද්‍යාලයට රු. මිලියන 7.4ක මුදලක් බාහිර අරමුදල් සපයන නියෝජිතායතනවලින් පිරිනමන ලදී. මෙයට අමතරව, විශ්වවිද්‍යාලයේ සනාතන පර්යේෂණ

කමිටුව මඟින් නිදහස් කරන ලද රු. මිලියන 10 ක මුදලක් පර්යේෂණ කටයුතු සඳහා ජොෂ්ඨ කාර්ය මණ්ඩලය සාමාජිකයන් අතර බෙදා හරිමින් විශ්වවිද්‍යාලය සිය අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ ව්‍යාපෘති සඳහා අරමුදල් සපයා ඇත.

## 5.3 ප්‍රධාන සැලැස්ම හා සංයුක්ත සැලැස්ම

2020 සහ 2030 යන වසර සඳහා වූ මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලැස්ම වාස්තු විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩල කණ්ඩායමක් විසින් සකස් කරන ලදී. විශ්ව විද්‍යාලයේ සියලු වර්තමාන සංවර්ධන ක්‍රියාකාරකම් මෙම ප්‍රධාන සැලැස්මට සහ 2010 ඔක්තෝබර් මස සංශෝධනය කරන ලද 2010-2015 සඳහා වූ සංයුක්ත සැලැස්මට අනුව සිදු කරනු ලැබේ. 2010 ඔක්තෝබර්හිදී විශ්වවිද්‍යාල සනාතන සභාව මඟින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම ඒ පිළිබඳ උනන්දුවක් දක්වන සියලුම තැනැත්තන් සමඟ පවත්වන ලද සවිස්තාරාත්මක සාකච්ඡාවලින් පසුව ගොඩනගන ලදී.

2010-2015 සංයුක්ත සැලැස්ම සමාලෝචනය කිරීමේ දී මොරටුව විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය අවශ්‍යතාවයන් එතරම් වැදගත් නොවන සිය ඉලක්ක හා පරමාර්ථවලින් බොහොමයක් දැනටමත් අත්පත් කර ගෙන ඇති බවත් ඉතිරි ඉලක්ක අත්පත් කර ගැනීමේ කටයුතුවල නිරත වෙමින් ඇති බවත් පෙනේ. මෙයට අමතරව, 2020 සහ 2030 සඳහා වූ ප්‍රධාන සැලැස්ම "මහින්ද චින්තනය: නව ශ්‍රී ලංකාවක් සඳහා වූ ඉදිරි දැක්ම"ට සමගාමීව සකස් කර ඇත. ප්‍රධාන කාර්යසාධන දර්ශක හා වගකිවයුතු පාර්ශ්ව හඳුනා ගැනීම මඟින් ප්‍රගතිය අධීක්ෂණය කිරීම පිණිස වූ සංයුක්ත සැලැස්ම මත පාදක වූ වසර දෙකක ක්‍රියාකාරී සැලැස්ම සෑම වසරකම සකස් කරනු ලැබේ. මෙහිදී සමාලෝචනයට භාජනය වන්නේ 2012 වසර සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මයි. ප්‍රධාන සැලැස්ම සහ සංයුක්ත සැලැස්ම යන දෙකම වර්තමානය වන විට සමාලෝචනයට භාජනය වෙමින් ඇති අතර 2013 ජනවාරි මාසය අවසානයේ දී එම වැඩකටයුතු අවසන් වනු ඇත.

## 5.4 ප්‍රාග්ධන ආයෝජන

මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් පුළුල් කිරීමට සමගාමීව පසුගිය වසර පහක කාලය තුළ සිදු කෙරෙමින් පැවති පහත දැක්වෙන ව්‍යාපෘති අතුරින් තවත් ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් සම්පූර්ණ කිරීමට ලැබීම විශ්වවිද්‍යාලය ලැබූ මහඟු ජයග්‍රහණයක් විය.

| ව්‍යාපෘතිය | වටිනාකම (රු. මිලියන) | තත්ත්වය |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ පීඨය - 1 වන අදියර | 315 | 2008 දී සම්පූර්ණ කරන ලදී |
| රසායනික ඉංජිනේරු කේන්ද්‍රය | 99 | 2008 දී සම්පූර්ණ කරන ලදී |
| කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ල | 130 | 2010 දී සම්පූර්ණ කරන ලදී |
| පන්ති කාමර ගොඩනැගිල්ල විශාල කිරීම - 1 වන අදියර | 47 | 2010 දී සම්පූර්ණ කරන ලදී |
| පන්ති කාමර ගොඩනැගිල්ල විශාල කිරීම – 11 වන අදියර | 96 | 2009 දී සම්පූර්ණ කරන ලදී |
| සිවිල් ඉංජිනේරු පර්යේෂණ කේන්ද්‍රය | 132 | 2011 දී සම්පූර්ණ කරන ලදී |
| වාස්තුවිද්‍යා පීඨය - 1 වන අදියර | 73 | 2011 දී සම්පූර්ණ කරන ලදී |
| දකුණු ආසියානු ජල කළමනාකරණය සඳහා වන මදන්ජීට් සිං කේන්ද්‍රය (බාහිර අරමුදල්) | 50 | 2012 දී සම්පූර්ණ කරන ලදී |
| ඇඟළුම් හා රෙදිපිළි දෙපාර්තමේන්තුව විශාල කිරීම | 83 | 2012 දී සම්පූර්ණ කරන ලදී |
| ප්‍රවාහන හා පහසුකම් කළමනාකරණ ගොඩනැගිල්ල | 148.2 | කෙරෙමින් ඇත |

| | | |
|---|---|---|
| වාස්තුවිද්‍යා පීඨය - 11 වන අදියර | 140 | කෙරෙමින් ඇත |
| වාස්තුවිද්‍යා පීඨය - 111 වන අදියර | 72 | කෙරෙමින් ඇත |
| වාස්තුවිද්‍යා පීඨය - 1V වන අදියර | 150 | කෙරෙමින් ඇත |
| තොරතුරු තාක්ෂණ වාස්තුවිද්‍යා පීඨය - 11 වන අදියර | 200 | කෙරෙමින් ඇත |
| පරිපාලන ගොඩනැගිල්ල | 282 | කෙරෙමින් ඇත |
| කාන්තා නේවාසිකාගාරය (ශිෂ්‍යාවන් 400 ක් සඳහා) | 194 | කෙරෙමින් ඇත |

2012 වසරේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා භාණ්ඩාගාරයෙන් ඉදිකිරීම් සඳහා ලැබුනු ප්‍රාග්ධන ආයෝජනය රු. මිලියන 88 ක් වූ අතර ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය සඳහා ලැබූ මුදල රු. මිලියන 43 ක් ද ස්ථාවර වත්කම් ලබා ගැනීම සඳහා ලත් මුදල රු. මිලියන 138 ක් ද විය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ලබා දුන් මුදල් වෙන් කිරීම විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම උපයෝජනය කර ගන්නා ලදී. මෙයට අමතරව, අනෙකුත් මූලාශ්‍ර හා විශ්ව විද්‍යාල සංවර්ධන අරමුදල හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල්වලින් උපචිත රු. මිලියන 17.95 ක් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 380 අනුව 2012 වසරේ දී නව ප්‍රාග්ධන උපකරණ මිල දී ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ආයෝජනය කරන ලදී. තවද, කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය (සහ වෙනත් දායකයන්) වෙතින් රු. මිලියන 47.14 ක මුදල් පරිත්‍යාග ද උපකරණ ඇතුළු ප්‍රාග්ධන වත්කම් සඳහා විශ්වවිද්‍යාලයට ලැබුනු අතර ඇඟළුම් හා රෙදිපිළි තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ඊසාන දිග ව්‍යාප්ත ගොඩනැගිල්ල සඳහා ඇඟළුම් හා රෙදිපිළි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුනු රු. මිලියන 10.57 ක් 2012 වසරේ දී වියදම් කරන ලදී. එමෙන්ම දකුණු ආසියානු ජල කළමනාකරණ පුහුණු කේන්ද්‍රය ඉදිකිරීම සඳහා මදන්ජීට් සිං අරමුදලෙන් ලැබූ රු. මිලියන 29.73 ක මුදල ද 2012 වසරේ දී වැය කරන ලදී.

ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක් වන විසි එක්වන ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතියේ (HETC) විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රතිපාදන, බාහිර උපාධි වැඩසටහන් සහ ගුණාත්මක හා නවෝත්පාදන ප්‍රතිපාදන යන අංග යටතේ අරමුදල් සපයා ගැනීමටත් මානව සම්පත් සංවර්ධන අංගය යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අට දෙනෙකුට දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල දර්ශනශූරී උපාධි සහ පර්යේෂණ පාදක ශාස්ත්‍රපති උපාධි ලබා ගැනීම සඳහා වූ ශිෂ්‍යත්ව ලබා ගැනීමටත් හැකියාව උදා විය.

එමෙන්ම තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා දියුණු කිරීම, ඉංග්‍රීසි භාෂා කුසලතාව වර්ධනය කිරීම, මෘදු කුසලතා ශක්තිමත් කිරීම සහ වාර්ගික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම් 4 යටතේ යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 40 ක මුදලක් විශ්වවිද්‍යාලයට ලැබිණි. ව්‍යාපෘතිය 2011 වසරේ ජූලි මස ආරම්භ විය. එමෙන්ම පොත්, ඉගෙනුම් මෘදුකාංග සහ විද්‍යුත් සම්පත් මිලදී ගැනීම සඳහා HETC ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 9.0 ක ප්‍රදානයක් ද විශ්වවිද්‍යාලයට ලැබුන අතර එම ප්‍රතිපාදන ද සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගෙන ඇත.

## 5.5 නවෝත්පාදක සහ ව්‍යවසායකත්ව හැකියාවන් සහිත උපාධිධාරීන් බිහි කිරීම

වසර තුනක් සඳහා ජාතික සංවර්ධන බැංකුවේ මූල්‍ය සහයෝගීතාව ඇතිව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පළමු වරට ඇති කළ කර්මාන්ත සහයෝගී සභාපතිත්වය සහිත "ව්‍යවසායකත්වය පිළිබඳ එන්ඩීබී බැංකුවේ විනිදත් මහාචාර්යවරයා/සාමාජික" යන ගෞරව ධූරය මොරටුව විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලදී. මේ යටතේ වූ පළමු විනිදත් මහාචාර්යවරයා 2010 වසරේ ඔක්තෝබර් මාසයේ දී පත් කරන ලදී.

මෙම වැඩපිළිවෙළ යටතේ දියත් කළ සමාරම්භක වැඩසටහනක් ලෙස ශිෂ්‍යයන්ට සිය සාමාන්‍ය අධ්‍යයන කටයුතු පවත්වාගෙන යන අතරතුරදීම අනුකාරක පරිසරයක් තුළ සැබෑ සමාගමක් ඇති

කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇවර කිරීම ආදිය පිළිබඳ වූ ක්‍රියාවලිය අනුගමනය කිරීම මඟින් ඔවුන්ට ඔවුන්ගේම ව්‍යාපාරික කටයුත්තක් ඇරඹීමට විශ්වවිද්‍යාලය විසින් පහසුකම් සපයනු ලැබේ. වර්තමානයේ දී මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා තරුණ ව්‍යවසායකයන්ගේ ආයතනය (YESL) විසින් පහසුකම් සලසන අතර ඒ අනුව ශිෂ්‍ය සමාගම් 30 ක් සඳහා පහසුකම් සැලසීමට හැකියාව ලැබී ඇති අතර 2012 වසරේ දී මෙලෙස පහසුකම් ලැබූ ශිෂ්‍ය සමාගම් සංඛ්‍යාව 22 ක් වේ.

මෙයට අමතරව, ශිෂ්‍යයන්ට ව්‍යවසායකත්වය පිළිබඳව සුළු විශේෂීකරණයක් ලබා ගැනීම සඳහා හැදෑරිය හැකි විෂයන් රාශියක් ඇතුලත් විෂයමාලාවක් මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී ඉංජිනේරු උපාධියට ඇතුළත් වන අතර ඒ අනුව මෙම ක්ෂේත්‍රය පිළිබඳව උනන්දුවක් දක්වන ශිෂ්‍යයන්ට ව්‍යවසායකත්වය පිළිබඳව සිය දැනුම සහ කුසලතා දියුණු කර ගැනිමේ හැකියාව ඇත.

වසර 10 කට වැඩි කාලයක් තිස්සේ අප්‍රිකාවේ සාර්ථකව අත්දැක සහ ක්‍රියාත්මක කර ඇති මැසචුසෙට්ස් තාක්ෂණ ආයතනයේ - තොරතුරු තාක්ෂණ නවෝත්පාදන ත්වරක ජංගම තාක්ෂණ බීජෞෂණය සහ ව්‍යවසායකත්ව වැඩසටහන (MIT-AITI) නවීන අදහස් ඇති උපාධිධාරීන් බිහිකිරීම සඳහා වූ තවත් මූලික වැඩසටහනක් වේ. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ මෝටර් රථ තාක්ෂණයේ නවීකරණ හරහා උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් තුළ ව්‍යවසායකත්ව ආකල්ප සහ නිපුණතා රෝපණය කිරීමයි. එම්අයිටී ආයතනය, MIT (USA) මඟින් නිර්දේශ කරන ලද මෝටර් රථ ව්‍යවසායකත්වය පිළිබඳ විශේෂඥ දැනුම සහිත විද්වතුන් තිදෙනෙක් විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ දී සති හයක් පුරා මෙම වැඩසටහන පවත්වනු ලැබේ. සති හයක කඩිනම් පුහුණු පාඨමාලා කාලය තුළ ශිෂ්‍යයන් සැබෑ ආරම්භයක් ලබන අතර පාඨමාලාව අවසන් වන්නේ ඔවුන් විසින් සිදු කරනු ලබන නිරූපණය කිරීම් ඇති දිනයක් සමඟය. 2011 වසරේ දී නව නිපදවීම් හයක් සිදු කරන ලද අතර 2012 වසරේ දී නව ආරම්භයන් හතක් සඳහා නව සොයාගැනීම් හතක් දියත් කරන ලදී.

## 5.6 විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරිත්වය

පශ්චාත් උපාධි වැඩසටහන්, කෙටිකාලීන වැඩසටහන්, පුහුණු හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා, සමුළු, වැඩමුළු, උපදේශක මණ්ඩල හා පරීක්ෂණ පැවරුම්, කර්මාන්තයේ අරමුදල් ආධාර ලද පර්යේෂණ හා සංවර්ධන විද්‍යාගාර, දෙපාර්තමේන්තු කර්මාන්ත උපදේශක මණ්ඩල, පීය කර්මාන්ත උපදේශක මණ්ඩල, සහ සංස්ථා සමාජ වගකීම් ක්‍රියාකාරකම් යනාදිය හරහා මොරටුව විශ්වවිද්‍යාලය කර්මාන්තය සමඟ ඉතා වැදගත් අන්තර් ක්‍රියාකාරීත්වයක් සිදු කරයි. කර්මාන්තය සහ සමාජය අතර ඇති අන්තර්ක්‍රියාකාරීත්වයන් ඔස්සේ කර්මාන්තවල දියුණුව සහ ඒ අනුව රටේ ආර්ථික සංවර්ධනය සිදුවීම මෙන්ම එයට අමතරව එමඟින් විශ්වවිද්‍යාල කාර්යමණ්ඩල සාමාජිකයන්ට, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ ඒවාට සමානවම විශ්ව විද්‍යාල ආයතනයටත් විශාල ප්‍රතිලාභ රැසක් හිමිවන බැවින් මෙම අන්තර්ක්‍රියාකාරිත්වයන් විශ්වවිද්‍යාලයේ නොමඳ දිරිමත් කිරීමට ලක් වේ.

සන්නිවේදනය සඳහා වූ ඩයලොග් මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ විද්‍යාගාරය, විදුලිසංදේශ ක්ෂේත්‍රය තුළ කර්මාන්ත පාදක පර්යේෂණ හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ ඉතා සාර්ථක ආදර්ශයක් බවට පත් වී ඇත. මෙම විද්‍යාගාරයේ සාර්ථකත්වය ඉලෙක්ට්‍රොනික් ආශ්‍රිත නව තාක්ෂණ සඳහා වූ "මයික්‍රොසොෆ්ට් විද්‍යාගාරය", "කලාප 24X7 මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ විද්‍යාගාරය" ද ආහාර තාක්ෂණය සඳහා වූ "කාගිල්ස් මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ රසායනාගාරය" ද රබර් හා හම් නිෂ්පාදන සඳහා වූ "ඩීඑස්අයි-මොරටුව විශ්වවිද්‍යාල රසායනාගාරය" ද ආරක්ෂාකාරී ධාවනය සඳහා වූ "ඩීඅයිඑම්ඕ-මොරටුව විශ්වවිද්‍යාලය" පිහිටුවීමට මඟ පාදා ඇත. 2012 වසරේ දී ද මෙම කර්තව්‍යයන් අඛණ්ඩව තවත් ඉදිරියට ගෙන ගිය අතර ජෛව වෛද්‍ය තාක්ෂණ සඳහා වූ "ප්‍රීමියම් ඉන්ටර්නැෂනල් - මොරටුව විශ්වවිද්‍යාලය" නම් නව පර්යේෂණ හා සංවර්ධන සහයෝගීතාවන් තුනක්, කර්මාන්ත හවුල්කාර ආයතනය සමඟ එක්ව පිහිටුවන ලදී.

මෝස්තර (මෝස්තර නිර්මාණය හා නිෂ්පාදන සංවර්ධනය) පිළිබඳ ප්‍රථම උපාධි වැඩසටහන, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, මොස්තර පිළිබඳ ලන්ඩන් විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලය යන ආයතන අතර වූ සහයෝගය මත සකස් කරන ලද්දක් විය. මෙහි සාර්ථකත්වය මත පදනම්ව මොරටුව විශ්වවිද්‍යාලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයට මහඟු පිටිවහලක් ගෙන දෙන්නා වූ සහයෝගීතා ව්‍යාපෘති රැසක් ආරම්භ කර ඇත. උදාහරණයක් ලෙස, ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් නිෂ්පාදන අංශයට සිය මූලාකෘති ශ්‍රී ලංකාව තුළදීම නිපදවීමට හා පරීක්ෂා කිරීමට ආධාර කිරීම පිණිස (NSF මඟින් දායක වූ) රු. මිලියන 40ක් වටිනා කඩිනම් මූලාකෘති යන්ත්‍රයක් ද ශ්‍රී ලංකාවේ සායම් හා වාත්තු නිෂ්පාදකයන්ට විශාල ලෙස ප්‍රයෝජනවත් වූ රු. මිලියන 100ක පිරිවැයක් යොදවන ලද සායම් හා වාත්තු මධ්‍යස්ථානය ද ත්‍රිවීල් රථ විදුලි බලයෙන් ධාවන කිරීම සඳහා පරිවර්තනය කිරීම ද කොහු කර්මාන්තය දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතීන් ද කඩිනම් මූලාකෘති පහසුකම් සඳහා වැඩිදුර ආධාර ද කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය, කර්මාන්ත සමාගම් සහ මොරටුව විශ්වවිද්‍යාලය අතර ඇති කර ගත් සහයෝගීතා වැඩපිළිවෙල හරහා දියත් කළ කාර්යයන් අතර වේ. නවෝත්පාදක තාක්ෂණ ව්‍යවසායකයන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා කර්මාන්ත අමාත්‍යාංශය මඟින් පිරිනමන රු. මිලියන 10 ක මූල්‍ය ආධාර සමඟ ඔවුන් බලගැන්වීම සඳහා ඇති කළ ඉලෙක්ට්‍රොනික් හා විද්‍යුත් තාක්ෂණික ඉන්කියුබේටරය 2012 වසරේ දී කරන ලද තවත් මුල්පිරීමක් වූ අතර අද වන විට එය නවෝත්පාදන වාණිජකරණය දක්වා පරිවර්තනය කිරීමට ආධාර කරන්නා වූ ව්‍යාපෘතියක් බවට පත් වී ඇත.

කාර්ය මණ්ඩල සාමාජිකයන් රජය, ආධාර දෙන නියෝජිතායතන සහ කර්මාන්තය වෙනුවෙන් නවෝත්පාදක පර්යේෂණ හා උපදේශක ව්‍යාපෘති අඛණ්ඩව භාර ගනිමින් ජාතික සංවර්ධනයට අතිමහත් වූ දායකත්වයක් දක්වන අතර විශ්වවිද්‍යාලය සඳහා ද ආදායමක් උපයා දීමට සමත් වෙයි. එවන විශේෂිත සේවාවන් ලබා ගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ දැඩි ආකර්ෂණයට භාජනය වී ඇත. මුලතිවු හා ඔඩ්ඩුසුඩාන් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ලබා දුන් විශ්වවිද්‍යාලයේ ප්‍රවීණතාවය, ලෝඩ්ස්ටා (Loadsta) පෞද්ගලික සමාගමේ එතෙක් පිහිටුවන ලද පළමු රෝබෝ මැනිපියුලේටර් යන්ත්‍රය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සඳහා වූ ගැමා මූලිනුපුටා දැමීමේ ව්‍යාපෘතිය, හැමිල්ටන් ඇළ ව්‍යාපෘතිය, නෙළුම් කුළුණ, රාජ්‍ය අංශයේ සේවා අයතන කිහිපයක ස්වයංක්‍රීය යන්ත්‍ර භාවිතය, ඊ-පාලනය හා පරිගණකගත කිරීම මේ සඳහා වන උදාහරණ වේ.

මොරටුව විශ්වවිද්‍යාලය විසින් මෙම ක්‍රියාවලිය සඳහා අභ්‍යන්තරව පහසුකම් සැලසීම සඳහා එහිම මූල්‍ය ආධාරය මත විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරී කුටීරයක් (UIIC) පිහිටුවා ඇත. ජාතික වැදගත්කමක් ඇති ව්‍යාපෘති කීහිපයක් භාරගැනීම සහ සාර්ථකව අවසන් කිරීම සිදු කර ඇති විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සහ කර්මාන්තයේ ප්‍රමුඛයන් එකට යා කිරීමට සමත්වීම හරහා මෙම ආයතනය එහි අගය මැනවින් සාක්ෂාත් කොට ඇත. අනෙක් විශ්වවිද්‍යාලවල ද කර්මාන්ත හා ප්‍රජා අන්තර් ක්‍රියාකාරී කුටීර සකස් කරන ලෙසට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටීමට මොරටුව විශ්වවිද්‍යාලයේ ඇති මෙම ඉතා සාර්ථක විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරී කුටීර (UIIC) ආදර්ශය භාවිතා කර ඇත. මෙයට අමතරව, මොරටුව විශ්ව විද්‍යාලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සැදුම් ලත්, ලාභ නොලබන සංගමයක් වන විශ්වවිද්‍යාල-උපදේශන සේවාව පිහිටුවා ඇති අතර සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ සංස්ථාපනය කර ඇති එය කර්මාන්තය සමඟ ඇති කර ගනු ලබන අන්තර්ක්‍රියාකාරීත්වයේ බාහිර බාහුව ලෙස කටයුතු කරන්නා වූ මොරටුව විශ්වවිද්‍යාලයේ බොහොමයක් නවෝත්පාදන මූලාරම්භයන් සඳහා හවුල්කරුවෙක් බවට පත්ව ඇත.

සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරී කටයුතුවල නියැලෙන අතරම රජයේ ඒකාබද්ධ අරමුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ලබා දෙනු ලබන ප්‍රදානයන් සඳහා ඔවුන් අධ්‍යයන අංශයෙන් වගවන බව තහවුරු කිරීම පිණිස ඔවුන් විසින් උපාධි අධ්‍යයන කටයුතු සම්බන්ධව සිය නිර්දේශිත අධ්‍යයන වැඩ නියමයන් සහ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරන බවට වගබලා ගැනීම විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ ප්‍රතිපත්තිය වේ. උපාධිධාරීන්ගේ උසස් පුහුණුවීම් හා සුදුසුකම් ඉහළ නැංවීම වෙනුවෙන් පිරිනමන

පාඨමාලා; දැනුම හා තාක්ෂණ සංවර්ධනය හා මාරු කිරීම සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, CPD පාඨමාලා, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, සම්මන්ත්‍රණ, වැඩමුළු හා අනෙකුත් අධ්‍යයන පැවරුම්; කර්මාන්තය උදෙසා උපදේශනය හා පරීක්ෂණ පැවරුම්; සහ සංස්ථා සමාජ වගකීම් ක්‍රියාකාරකම් ආදිය අංක 380 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව **පිරිවැය ප්‍රතිසාධනය** කර ගැනීමේ (ස්ව-මුදල් සැපයීමේ) පදනම මත දියත් කරනු ලබන වැඩසටහන් වේ. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලය සමාජය හා කර්මාන්තය වෙනුවෙන් ඇති සිය බැඳියාව ඉටු කරනු ලබන්නේ රජයට **කිසිදු පිරිවැයක් නොමැතිවයි.**

2012 වසරේ දී මොරටුව විශ්වවිද්‍යාලය සිය **පිරිවැය ප්‍රතිසාධන** (ස්ව-මුදල් සැපයීමේ) කටයුතු සහ ව්‍යවසායකත්ව කටයුතු සඳහා වූ සිය කර්මාන්ත මුල්පිරීම් හරහා රු. මිලියන 234. 95ක මුදලක් උපයා ඇත. අංක 380 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව උත්පාදිත ආදායම උපයෝගී කර ගෙන ඇත.

## 5.7 තත්ව සහතිකය

විශ්වවිද්‍යාල සනාතන සභාව මඟින් මොරටුව විශ්වවිද්‍යාලය සඳහා වූ තත්ව සහතික ප්‍රතිපත්තියක් අනුමත කර ඇත. මොරටුව විශ්වවිද්‍යාලයේ තත්ව සහතික කිරීම එහි සේවාවල සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳව ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට හා සමස්තයක් ලෙස මුළු ප්‍රජාවටම තහවුරු කිරීම සඳහා එහි ඉගෙනුම් යෙදවුම්, අධ්‍යාපන ප්‍රතිඵල, කාර්යසාධන ඇගයීම් සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල ප්‍රමිතීන්, පාරදෘශ්‍ය ආකාරයකින් හා කාර්යක්ෂමව හා විශ්වාසදායක ලෙස වලංගු කරන්නා වූ විශ්වවිද්‍යාල කළමනාකරණයේ ක්‍රියාවලියක් වේ.

තත්ව සහතික ක්‍රමෝපාය (QAS) මඟින් යථාර්ථය, අතිශයෝක්තිය සමඟ ගලපනු ලබයි. විශ්වවිද්‍යාල සංයුක්ත සැලැස්මේ දක්වා ඇති දැක්ම හා මෙහෙවර එහි ආරම්භක ලක්ෂ්‍ය වේ. සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ දී විශ්වවිද්‍යාල කළමනාකරණය මඟින් එහි සේවාවල සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පද්ධති හා ක්‍රියාවලීන් පිහිටුවනු ලැබේ. ඒ අනුව, සංයුක්ත සැලැස්මේ නිශ්චිතව දක්වා ඇති ඉලක්ක ගුණාත්මක ප්‍රතිපත්තිවලට පරිවර්තනය කර ඇති අතර ඒවා ගුණාත්මක ඉලක්ක දහයක් වෙත ගොනු කර ඇත. තවද මෙම ගුණාත්මක ඉලක්ක දහයේ එක් එක් ඉලක්කය ප්‍රමුඛතා කාර්යයන්වලට බෙදා ඇත. එක් එක් කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා වගකීම දරන නිලධාරියා/පාර්ශ්වකරු හඳුනාගෙන ඇත.

මොරටුව විශ්වවිද්‍යාලයේ දී සිය මූලික උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට, කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට ඉතා ප්‍රයෝජනවත් අත්දැකීමක් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරන අතර තත්ව සහතික ක්‍රමෝපාය මඟින් එහි අරුත හෙළිදරව් කරන්නා වූ දැ පිරිනමනු ලැබේ. විශිෂ්ඨ විශ්වවිද්යාලයකින් ලබා ගත හැකි උත්කෘෂ්ට ඉගෙනුම හා අධ්‍යාපනය වන්නේ කුමක්දැයි පිළිබඳ පැහැදිලි සිතුවමක් ද එමඟින් ලබා දෙයි. ඉගෙනුම් යෙදවුම් හා අධ්‍යාපන ප්‍රතිඵල සිදු වන බාහිර හා අභ්‍යන්තර සන්දර්භයක් තත්ව සහතික ක්‍රමෝපාය මඟින් නිරූපණය වන අතර ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා වූ පීඨ මට්ටමේ නව ක්‍රමෝපායන් ද එමඟින් විස්තර කරනු ලැබේ.

එමෙන්ම, විවිධ පසුබිම්වලින් පැමිණෙන කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට ලද හැකි ඉඩප්‍රස්තාවලින් ප්‍රයෝජන ලැබීමටත්, අධ්‍යාපනික වශයෙන් හා පෞද්ගලිකව දියුණු වීමටත්, එමෙන්ම පිටත ලෝකයේ සාර්ථකත්වයට දායක වීමටත් හැකි වන්නේ නම්, ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමක් ද යන්න පිළිබඳව තත්ව සහතික ක්‍රමෝපාය (QAS) ඉලක්ක කරයි. ඉගැන්වීම්වල ගුණාත්මකභාවය සහ ඒ කෙරෙහි ආයතනය තබන අගය මෙහි කොටසක් වන අතර මොරටුව විශ්වවිද්‍යාලයේ කටයුතු මේ සම්බන්ධව ඇති වෘත්තීය විශිෂ්ඨත්වයට සමගාමීව පවතින බව තහවුරු කිරීම සැලසුම් කිරීම පිණිස වූ කටයුතු තත්ව සහතික ක්‍රමෝපායට (QAS) ඇතුළත් වේ.

මෙයට අමතරව සලකා බලන විට, ඉගැන්වීම් ප්‍රතිඵල, කාර්යසාධන ඇගයීම්, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ ව්‍යාපාර යනාදිය එකිනෙකට ඌනපූරක වන බවත් ඒවායේ අන්තර්සම්බන්ධතාව සම්බන්ධව

අද්විතීය දැක්මක් පිහිටුවීමට ආධාර කරන බවටත් තත්ව සහතික ක්‍රමෝපාය (QAS) සලකයි. දිනෙන් දින තරඟකාරී වන පරිසරයක් තුළ, තනි පුද්ගලයන්ට හා සමාජයට අවශ්‍ය වන දෑ සැපයීමට වර්ධනය වන පීඩනය හමුවේ සහ ආයතනය එහි තරඟකරුවන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ මෙහෙවරේ විවිධ අංශයන් නැවත තහවුරු කර ගැනීමට තත්ව සහතික ක්‍රමෝපායන් (QAS) උපකාරී වේ. විශ්වවිද්‍යාලය සෑමවිටම පෝෂණය කළ අගයන් පහත හෙළීමකින් තොරව වෙනස්කම් සමඟ වඩා හොඳින් කටයුතු කිරීමේ හැකියාව එමඟින් විශ්ව විද්‍යාල වෙත සැපයිය යුතුය.

විශ්වවිද්‍යාල උපකුලපතිතුමා සභාපතිත්වය දරන, විශ්වවිද්‍යාල නිලධාරීන් සහ සියලු වෘත්තීය සමිතිවල නියෝජිතයන් අතර පවත්වන්නා වූ මාසික "පසුවිපරම" 2006 වසරේ මාර්තු මාසයේ සිට පවත්වනු ලබන අතර විශ්වවිද්‍යාලයේ ඉලක්ක සාක්ෂාත් කර ගනු වස් විශ්වවිද්‍යාලයේ සහ කාර්ය මණ්ඩලයේ ඵලදායීත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රම හා විධි එහිදී සාකච්ඡාවට භාජනය වේ. මෙයට අමතරව, අදාළ මාසය තුළ විසඳා ගත යුතු ශිෂ්‍ය ප්‍රජාව සම්බන්ධ වැදගත් ගැටළු සාකච්ඡා කිරීම පිණිස වූ උපකුලපතිතුමා සභාපතිත්වය දරණ විශ්වවිද්‍යාල නිලධාරීන් සහ සියලුම ශිෂ්‍ය සමිතිවල කමිටු නිලධාරීන් අතර පවත් වනු ලබන සම්බන්ධතා රැස්වීමක්ද සෑම මාසයකදීම රැස් වේ. තවද පීඨ මට්ටමේ ඇති ශිෂ්‍ය ගැටළු සාකච්ඡා කර විසඳා ගැනීම සඳහා වූ පීඨයේ පීඨාධිපතිගේ සභාපතිත්වය සහිත කාර්ය මණ්ඩල-ශිෂ්‍ය සම්බන්ධතා රැස්වීමක් ද සෑම මාසයකම සියලුම පීඨවල පවත් වනු ලබයි. මෙම සියලු රැස්වීම් විශ්වවිද්‍යාලයේ වාර්ෂික දින දර්ශනයේ ඇතුළත් අංගයන් වේ.

## 5.8 සංරෝධන

2010-2015 සංයුක්ත සැලැස්මේ 1-8 දක්වා වූ ඉලක්ක බොහොමයක් සැලකිය යුතු ලෙස අත් කර ගෙන ඇත. කෙසේවුව ද, මොරටුව විශ්වවිද්‍යාලයට රජයේ අරමුදල් මත යැපෙන්නට සිදු වී ඇති ක්ෂේත්‍ර සම්බන්ධව ඉලක්ක හා පරමාර්ථ සාක්ෂාත් කර ගත යුතුව ඇත. උදාහරණයක් ලෙස, පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම 2011 වසරේ දී සිදු කළ යුතු බවටත් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉහළ යන ශිෂ්‍ය බඳවා ගැනීම් වෙනුවෙන් ශිෂ්‍යාවන් 400 ක් සඳහා වූ කාන්තා නේවාසිකාගාරය ඉදිකිරීම වසර 2011 දී ආරම්භ කළ යුතු බවටත් 2010-2015 සංයුක්ත සැලැස්මෙන් හඳුනා ගෙන ඇත. එමෙන්ම තවත් ගොඩනැගිලි කීපයක ඉදිකිරීම් කටයුතු ද සැලකිය යුතු තරම් කාලයක් ප්‍රමාද වී ඇත. ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීම සැලසුම් කරන ලද පරිදි සිදු කළ ද අනුමත ව්‍යාපෘති සඳහා වූ සීමිත මුදල් වෙන්කිරීම මඟින් ඉඩකඩ සම්බන්ධව සීමාකිරීම් කිහිපයක් ඇති වී ඇත. විශ්වවිද්‍යාලය පොරොන්දු වූ කාර්යයන් රැසක් මොරටුව විශ්වවිද්‍යාලය මඟින් ඉටු කිරීම පිළිබඳ උදාහරණ රැසක් ඇති නමුත් රජයේ මූල්‍ය සීමාකිරීම් හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සිය වගකීම් ඉටු කිරීමට නොහැකි වී ඇත.

විශ්වවිද්‍යාලය "සාමාන්‍ය මට්ටමට වඩා විවෘත" ස්ථානයක් විය යුතුය. අවාසනාවන්ත ලෙස, පුස්තකාලය, පරිගණක මධ්‍යස්ථාන සහ විද්‍යාගාර වන ශිෂ්‍යයන්ට හා කාර්ය මණ්ඩලයට අත්‍යවශ්‍ය සම්පත් දවසේ පැය 12 කටත් වැඩි කාලයක් වසා ඇත. එබැවින්, අත්‍යවශ්‍ය සම්පත්/සේවාවන් සහ යතුරු නිදහස් කිරීම ආදිය ආවරණය කරන සේවකයන්ට පමණක් ප්‍රදානය කරනු ලබන අතිකාල සේවාව වන රාජ්‍ය සේවයේ සීමාවන් වන මිනිස් බල නියාමන පාලන හේතුවෙන් අප භාවිතා කරන්නේ එවන සම්පත් හා පහසුකම්වලින් අඩක් පමණි. පරිපූර්ණ තත්වයක් ලෙස දින 7 ම පැය 24 පුරා විවෘතව ඇති විශ්වවිද්‍යාලයක් තිබීමට අප කැමති වුව ද, අවම වශයෙන් දිනකට පැය 16 ක් (දවසෙන් තුනෙන් දෙකක කාලයක්) සහ සතියකට දින 6 ක් විශ්වවිද්‍යාලය විවෘත කර තැබීමෙන් ඉතා කෙටි කලකින් අභාවිතයට යන පරිගණක හා වෙනත් උපාංග වන ප්‍රාග්ධන සම්පත් උපයෝගී කර ගැනීම ඉහළ නැංවීමට හැකි වනු ඇත. මිනිස් බල නියාමන පාලන මුල් අවස්ථාවේ දී ඇති කරන ලද සාමාන්‍ය රාජ්‍ය කාර්යාලකට වඩා වෙනස් ආයතනයක් ලෙස වර්තමානයේ දී විශ්වවිද්‍යාලය හඳුනාගනු ලැබීමට හැකි වන්නේ නම් එය ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට හා රජයට බොහෝ ප්‍රතිලාභ ගෙන ඒමට සමත් වනු ඇත.

වර්තමානය වන විට විශ්වවිද්‍යාල නේවාසික පහසුකම් සැපයෙන්නේ ශිෂ්‍යයන්ගෙන් 19% කට ආසන්න පිරිසකට පමණි. 2007 වසරේ දී අවසන් කරන ලද නව නේවාසිකාගාර ව්‍යාපෘතිය සමඟ මෙම තත්වය සුළු වශයෙන් දියුණු වුවද, නේවාසිකාගාර පහසුකම් අතින් මෙම විශ්වවිද්‍යාලය අනෙක් විශ්ව විද්‍යාලවලට වඩා පසුපසින් ඇත. එබැවින් මොරටුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් සඳහා පිරිනමන නේවාසික පහසුකම් වැඩිදියුණු කිරීමට රාජ්‍ය අරමුදල් සොයා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයට අඛණ්ඩව කටයුතු කිරීමට සිදු වේ.

විශ්වවිද්‍යාලය පිහිටා ඇත්තේ මොරටුව, කටුබැද්දේ පිහිටි අක්කර 53 ක ඉඩමකයි. වසර ගණනාවක් තිස්සේ කරගෙන යමින් පවතින පුළුල් කිරීමේ කටයුතු හේතුවෙන් අද වන විට මෙම භූමියේ ඉඩ ප්‍රමාණය ඉතා සීමා වී ඇත. ඉඩ සම්බන්ධව ඇති මෙම සීමාවන් මඟහරවා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය සිරස් ගොඩනැගිලි ඉදි කිරීමේ උපාය මාර්ගය දියත් කිරීමට උත්සාහ දරා ඇත. විශ්වවිද්‍යාලයක් සඳහා මහෝපකාරී වන පරිසරයක් පවත්වා ගැනීමට අවශ්‍ය සන්දර්භයක් තුළ මෙම ක්‍රමෝපාය මඟින් අදාළ ගැටළුවට සම්පූර්ණ විසඳුමක් ගෙන දෙනු ඇතැයි අපේක්ෂා කළ නොහැක. එබැවින් විශේෂයෙන්ම නේවාසිකාගාර පහසුකම් පුළුල් කිරීමේදී ඇතුළුව මොරටුව විශ්වවිද්‍යාලයට නව ඉඩම් අත්පත් කර ගැනීම, අද වන විට සපුරා ලිය යුතු අත්‍යාවශ්‍ය උවමනාවක් බවට පත් වී ඇත.

හෝමාගම, දියගම නැවත ස්ථාපනය කිරීමට නියමිත මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) වර්තමානය වන විට පිහිටා ඇත්තේ ද මොරටුව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළම ය. මෙම ආයතනය සම්පූර්ණයෙන්ම නැවත ස්ථාපනය කිරීම සඳහා වූ ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 89.5 ක ව්‍යාපෘතියේ වෙළඳ ගිවිසුමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ චීන ජාතික ගගන තාක්ෂණ ආයාත හා නිර්යාත සංස්ථාව 2012 වසරේ ජනවාරි මාසයේ දී අත්සන් කරනු ලැබුව ද මුදල් අමාත්‍යාංශය හා චීන අධාර මූලාශ්‍රය අතර ඇති කර ගත යුතු මූල්‍ය ගිවිසුම අත්සන් කිරීමට විශාල ප්‍රමාදයක් ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් විශ්වවිද්‍යාලය තුළ සාමකාමී පරිසරයක් ඇති කිරීමට පහසුකම් සැපයීම පමණක් නොව එමඟින් මොරටුව විශ්වවිද්‍යාලයේ හා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ ද කඩිනම් දියුණුවට පිටුබලය සැපයීම ද සිදුවනු ඇත.

පසුගිය වසර කිහිපය තුළ විශේෂයෙන්ම උපකරණ වන ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දුන් අරමුදල් අපේක්ෂා කළ මට්ටමට නොපැවතුණු අතර ඒ අනුව කැපීපෙනෙන අඩුපාඩු රැසක් ඇති වී ඇත. අන්තර්ජාතික සහතිකකරණ කණ්ඩායම් විසින් ද මෙම අඩුපාඩුව හඳුනාගෙන ඇති අතර අන්තර්ජාතික මට්ටමේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන අන්තර්ජාතික සහතිකකරණය රඳවා ගැනීමට හෝ ලබා ගැනීමට අභියෝගයක් වී ඇත. එමෙන්ම සංයුක්ත සැලැස්ම හා සැසඳීමේ දී ද විශ්වවිද්‍යාලයේ දියුණුව ප්‍රමාද කිරීමට ද මෙය හේතුවක් වී ඇත. කෙසේ වුවද, මොරටුව විශ්වවිද්‍යාලය සත්‍ය වශයෙන්ම අන්තර්ජාතික විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කිරීමෙහිලා රු. මිලියන 75 ක අතිරේක අරමුදලක් 2012 වසරේ දී සැපයීම විශ්ව විද්‍යාලයේ ඇගයීමට භාජනය වේ. කෙසේ වුව ද, මේ යටතේ ඉල්ලා සිටි සියලුම මුදල් 2012 වසරේ දී සම්පූර්ණයෙන්ම උපයෝගී කර ගැනීම සඳහා නිදහස් කර නොමැත.

කඩිනම් ආර්ථික වර්ධනය සඳහා වූ ක්‍රමෝපායන් ලෙස මූලාරම්භයන් නවීකරණය කිරීම, ඒ ආශ්‍රිත තාක්ෂණය දියුණු කිරීම, වාණිජකරණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාලවලට අන්තර්ජාතිකව කීර්තිමත් අනෙක් විශ්වවිද්‍යාල මෙන් ඉන්කියුබේටර් පිහිටුවීමට හැකියාව තිබිය යුතුය. විශ්වවිද්‍යාලවල ඇති ඉන්කියුබේටර් වලට අලාභ දැරිය නොහැකි බැවින් ඒවා නෛතිකව අවසර දෙනු නොලැබේ. බීජාධාර සහ සාර්ථකත්වය පිළිබඳව සහතිකයක් නොමැතිව ආධාර, හිමිකම සඳහා වූ නෛතික යාන්ත්‍රණය යනාදිය ඉන්කියුබේෂන් සඳහා අවශ්‍ය වේ. අවදානම් දැරිය හැක්කේ ශ්‍රී ලංකා නිමැවුම්කරුවන්ගේ කොමිෂමට පමණි. මීට සමාන ලෙස, විශ්වවිද්‍යාලවලම වාණිජකරණය වූ තාක්ෂණය සඳහා කොටස්කරුවෙක් වීමේ දී ව්‍යාපාර කාර්යයන්වලට එම විශ්වවිද්‍යාලවලටම හවුල්කරුවෙක් විය නොහැක. එවන සොයාගැනීම් සඳහා කර්තෘභාරය ලබා ගැනීම හෝ තාක්ෂණ සම්පූර්ණයෙන්ම විකිණීම එහි දී සිදු කළ හැකි එකම දේ වේ. නව ප්‍රධාන කාර්යසාධන දර්ශක ලෙස පේටන්ට් බලපත්‍ර, වාණිජකරණය වූ ශිල්පක්‍රම සහ ඇරඹුම් රාශියක් විශ්වවිද්‍යාලය මඟින් සලකා බැලීමත් සමඟ මෙම ප්‍රතිපත්තියේ වෙනසක් අවශ්‍ය වේ.

විශේෂයෙන්ම පර්යේෂණ හා සංවර්ධනය වැඩ ඉලක්ක කර ගත් පර්යේෂණ හා සංවර්ධන වැඩකටයුතු විශ්වවිද්‍යාලය විසින් දිරිමත් කරනු ලැබේ. කර්මාන්ත ගැටළු සඳහා ඉලක්ක පාදක පර්යේෂණ හා සංවර්ධන විසඳුම් සොයා ගැනීමට ඉල්ලීම් රාශියක් ඇත. කෙසේ වුවද, ප්‍රමාද වීම් සම්බන්ධව බොහෝවිට විශ්වවිද්‍යාල විවේචනයට ලක් වන අතර නියමිත කාලයට වැඩ සම්පූර්ණ කර බාර නොදීම හේතුවෙන් ඇතැම් ව්‍යාපෘති විශ්වවිද්‍යාලවලට නොපවරන අවස්ථා ද වේ. ඉතා දීර්ඝ කාලයක් ගන්නා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට අවශ්‍යවීම එක් හේතුවකි. පර්යේෂණ ප්‍රසම්පාදන කලින් සැලසුම් කළ හැක්කක් නොවන අතර එබැවින් ඉක්මනින් ප්‍රසම්පාදනය කිරීම අවශ්‍ය වේ. සාමාන්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීම විගණන විමසුම් රාශියකට මඟපාදයි. පර්යේෂණ වැඩ සඳහා ප්‍රසම්පාදනය කිරීමේ විශේෂ මාර්ග බොහෝ රටවල් සතුව ඇත. වර්තමානයේ දී විශ්වවිද්‍යාල අත්දකින මෙම ගැටළුව විසඳීම සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා විශ්වවිද්‍යාලවලම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ගොඩනඟන ලෙසට ඒවායෙන් ඉල්ලීම් කර ඇත.

| **ප්‍රාග්ධන ප්‍රදාන – වැය නොකළ** | **රුපි.** | **රුපි.** |
| ආරම්භක ශේෂය | 58,357,307 | - |
| භාණ්ඩාගාරය වෙතින් ප්‍රදාන | 169,165,061 | 154,569,784 |
| භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු ප්‍රදාන | 51,404,366 | 834,939 |
| අතිරේක දීමනාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රීඩා යටිතල පහසුකම් - SLUG 2013 - (යොමුව: පිටුව 25) | 30,000,000 | |
| විශ්වවිද්‍යාල පුස්තකාල සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රදාන - (යොමුව: පිටුව 2 | 1,000,000 | |
| UGC ප්‍රදානය කළ SDC - (යොමුව: පිටුව 25) | 5,000,000 | |
| ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල වලට පරිවර්තනය කිරීම සඳහා ප්‍රදාන - (යොමුව: පිටුව 25) | - | 98,185,158 |
| ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාල වලට පරිවර්තනය කිරීම සඳහා ප්‍රදාන - (යොමුව: පිටුව 25) පුනරාවර්තන වියදම් මාරු කිරීම් | 3,073,744 | |
| පුස්තකාලය සඳහා ගුණත්ව නවෝත්පාදන ප්‍රදාන- (යොමුව: පිටුව 25) | - | 25,000,000 |
| වෙනත් ප්‍රාග්ධන ලැබීම් | 2,709,907 | 20,438,642 |
| වාහන ලැබීම් | 2,750,000 | 21,650,000 |
| වත්කම් අත්පත් කර ගැනීම් | 181,064,870 | 179,734,851 |
| W.I.P මත අතරික්තය | 88,081,001 | 82,586,365 |
| **එකතුව** | **48,167,026** | **58,357,307** |

| සටහන – 15 | 2012 | 2011 |
|---|---|---|
| **උත්පාදනය කළ අරමුදල් – ප්‍රාග්ධන** | **රුපි.** | **රුපි.** |
| ආරම්භක ශේෂය | 257,379,189 | 226,429,971 |
| ගැළපුම් | - | 101,472.89 |
| උපකුලපතිතුමාගේ අරමුදල සහ වෙනත් දෙපාර්තුමේන්තු අරමුදල් | 17,952,341 | 30,847,745 |
| | 275,331,529 | 257,379,189 |
| ප්‍රාග්ධනය – නේවාසිකාගාර | 125,046 | 289,129 |
| **එකතුව** | **275,456,576** | **257,668,318** |

| සටහන – 16 | 2012 | 2011 |
|---|---|---|
| <u>පරිත්‍යාග - ප්‍රාග්ධන</u> | රුපි. | රුපි. |
| ආරම්භක ශේෂය | 972,337,916 | 917,857,581 |
| W.I.P මත අතිරික්තය | 40,305,412 | 38,855,920 |
| ලැබීම් | 47,143,100 | 15,624,416 |
| **එකතුව** | **1,059,786,429** | **972,337,916** |

| සටහන 17 | 2012 | 2012 | 2011 | 2011 |
|---|---|---|---|---|
| <u>සීමාකළ අරමුදල්</u> | රුපි. | රුපි. | රුපි. | රුපි. |
| උපයන ලද අරමුදල් | **151,950,859** | | **100,983,101** | |
| එකතු කළා - ලැබීම් | 247,985,002 | | 201,839,191 | |
| අඩුකළා - ගෙවීම් | (211,244,406) | | (150,871,433) | |
| | **188,691,455** | | **151,950,859** | |
| එකතු කළා - දෙපාර්තුමේන්තු ගිණුම් සහ පාඨමාලා සං: | 46,081,605 | | 48,144,688 | |
| | **234,773,060** | | **200,095,548** | |
| අවසන් ශේෂය | | **234,773,060** | | **200,095,548** |
| පරිත්‍යාග කළ අරමුදල් | **44,645,079** | | **14,356,774** | |
| එකතු කළා - ලැබීම් | 6,698,035 | | 98,252,163 | |
| අඩුකළා - ගෙවීම් | (30,561,015) | **20,782,098** | (67,963,859) | **44,645,079** |
| පර්යේෂණ ප්‍රදාන අරමුදල් | **1,674,171** | | **1,496,314** | |
| එකතු කළා - ලැබීම් | 4,494,006 | | 192,862 | |
| අඩුකළා - ගෙවීම් | (938,702) | **5,229,476** | (15,004) | **1,674,171** |
| බැඳුම්කර සහ ශිෂ්‍යත්ව අරමුදල | **76,166,008** | | **64,517,743** | |
| එකතු කළා - ලැබීම් | 9,222,751 | | 13,914,603 | |
| අඩුකළා - ගෙවීම් | (4,231,315) | **81,157,444** | (2,266,339) | **76,166,008** |
| වෙනත් අරමුදල් | **12,025,183** | | **14,323,923** | |
| එකතු කළා - ලැබීම් | 2,725,313 | | 155,760 | |
| අඩුකළා - ගෙවීම් | (251,631) | **14,498,864** | (2,454,500) | **12,025,183** |
| | | **356,440,941** | | **334,605,988** |

| සටහන – 18 | 2012 | 2011 |
|---|---|---|
| <u>පරිත්‍යාග අරමුදල්</u> | රුපි. | රුපි. |
| ආරම්භක ශේෂය | 15,513,844 | 13,957,715 |
| ලැබීම් | - | 1,733,160 |
| පොලී ලැබීම් | 1,448,087 | 2,005,690 |
| ගෙවීම් | (372,583) | (2,182,720) |
| **එකතුව** | **16,589,348** | **15,513,844** |

## 24.6 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන්

| සටහන 19 | 2012 | 2011 |
|---|---|---|
| **ලද පොලී** | රුපි. | රුපි. |
| ආයෝජන වලින් පොලී | 14,033,035 | 6,479,531 |
| ණය සහ අත්තිකාරම් වලින් පොලී | 3,345,657 | 2,721,011 |
| | **17,378,693** | **9,200,542** |

| සටහන 20 | 2012 | 2011 |
|---|---|---|
| **ශිෂ්‍යයන්ගෙන් ආදායම්** | රුපි. | රුපි. |
| ලියාපදිංචිය - උපාධි අපේක්ෂකයන් | 620,310 | 771,570 |
| පශ්චාත් උපාධි | 808,500 | 1,247,900 |
| අමතර ඉගැන්වීම් ගාස්තු - උපාධි අපේක්ෂකයන් | 1,079,089 | 1,316,743 |
| - පශ්චාත් උපාධි | 4,500 | 17,667 |
| විභාග ගාස්තු - උපාධි අපේක්ෂකයන් | 80,656 | 112,760 |
| - පශ්චාත් උපාධි | 104,250 | 134,550 |
| | **2,697,305** | **3,601,190** |

| සටහන 21 | 2012 | 2011 |
|---|---|---|
| **වෙනත් ආදායම්** | රුපි. | රුපි. |
| දේපළ වලින් කුලී | 195,010 | 423,124 |
| ප්‍රතිපූරණ | 93,994 | 187,685 |
| විවිධ ලැබීම් | 3,611,240 | 3,329,967 |
| පුස්තකාල දඩ | 222,073 | 345,724 |
| වෛද්‍ය ගාස්තු | 127,003 | 215,428 |
| පැරණි ගබඩා විකිණීම | 655,473 | 695,163 |
| | **4,904,793** | **5,197,091** |

| සටහන් 22 | 2012 | 2011 |
|---|---|---|
| **පුද්ගල වේතන** | රුපි. | රුපි. |
| අධ්‍යයන | | |
| වැටුප් සහ වේතන | 194,878,294 | 182,964,871 |
| දීමනා | 123,992,039 | 88,987,882 |
| ජීවන වියදම් දීමනා | 25,158,188 | 24,050,204 |
| UPF | 23,282,585 | 23,341,831 |
| විශ්‍රාම වැටුප් | 9,771,663 | 8,738,511 |
| E.T.F. | 7,109,901 | 6,447,112 |
| වැඩබලන ගෙවීම් | - | - |
| බාහිර කථිකාචාර්ය ගාස්තු | 7,530,194 | 7,473,164 |
| අනධ්‍යයන | | |
| වැටුප් සහ වේතන | 170,240,509 | 162,494,135 |
| දීමනා | 23,405,922 | 8,129,247 |
| ජීවන වියදම් දීමනා | 40,849,466 | 42,028,380 |
| භාෂා ප්‍රවීණත්ව දීමනාව | 836,520 | 909,504 |
| UPF | 22,022,031 | 24,211,367 |
| විශ්‍රාම වැටුප් | 10,791,335 | 8,380,058 |
| ETF | 8,025,289 | 6,460,514 |
| වැඩබලන ගෙවීම් | 262,698 | 263,793 |
| අතිකාල දීමනා | 18,829,503 | 21,935,186 |
| නිවාඩු ගෙවීම් | 171,874 | 187,971 |
| | **687,158,009** | **617,003,730** |

| සටහන 23 | 2012 | 2011 |
|---|---|---|
| **ගමන් සහ යැපීම් වියදම්** | රු.පි. | රු.පි. |
| දේශීය | 879,070 | 853,769 |
| විදේශීය | 3,024,234 | 2,610,855 |
| | **3,903,304** | **3,464,624** |

| සටහන 24 | 2012 | 2011 |
|---|---|---|
| **සුබසාධන සේවා** | රු.පි. | රු.පි. |
| නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු | 1,928,266 | 1,660,668 |
| වෛද්‍ය සැපයුම් | 398,707 | 329,853 |
| වැඩමුළු සම්මන්ත්‍රණ | 409,951 | 394,047 |
| සේවක සංවර්ධනය | 1,707,074 | 2,123,586 |
| නිවාඩු ගමන් බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර | 861,101 | 793,425 |
| ත්‍යාග සහ හානිපූරණ | 273,592 | 199,600 |
| පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව | 231,454 | 101,665 |
| ශිෂ්‍යයන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය සහ ඉගෙනුම් ගුණත්වය | 13,950 | 200,621 |
| කර්මාන්ත අභ්‍යාසලාභීත්වය සහ වෘත්තීය මගපෙන්වීම | - | 4,992 |
| ශිෂ්‍ය සංවර්ධන | | 79,812 |
| විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම් | 1,316,110 | 1,255,127 |
| ශිෂ්‍ය ශුභසාධනය, සේවක ශුභසාධනය, ශිෂ්‍ය සභා | 12,807 | 231,130 |
| සංයුක්ත සැලැස්ම,පාලනය සහ සමාජ සහභාගීත්වය | 116,233 | 224,593 |
| දායකත්වයන් සහ සාමාජික ගාස්තු | 1,480,098 | 902,818 |
| වෙනත් - ප්‍රවෘත්ති පත්‍ර, සඟරා යානාදිය | 12,996,572 | 11,058,512 |
| | **21,745,915** | **19,560,449** |

| සටහන 25 | 2012 | 2011 |
|---|---|---|
| **වෙනත් මෙහෙයුම් වියදම්** | රු.පි. | රු.පි. |
| පාලක මණ්ඩල සහ කමිටු සේවා | 391,500 | 474,994 |
| වෘත්තීය සහ වෙනත් ගාස්තු | 1,775,353 | 2,499,036 |
| සංග්‍රහ වියදම් | 1,674,235 | 2,980,298 |
| උපාධි ප්‍රදානෝත්සව | 600,000 | 442,080 |
| විභාග වියදම් | 6,564,744 | 2,166,632 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 18,135,496 | 15,647,313 |
| | **29,141,328** | **24,210,353** |

| සටහන 26 | 2012 | 2011 |
|---|---|---|
| **ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහාය** | රු.පි. | රු.පි. |
| මහපොළ ශිෂ්‍යත්ව | 5,736,500 | 10,310,400 |
| ශිෂ්‍යාධාර | 3,138,900 | 4,945,300 |
| පරිත්‍යාග ශිෂ්‍යත්ව | 81,900 | 113,100 |
| | **8,957,300** | **15,368,800** |

| සටහන 27 | 2012 | 2011 |
|---|---|---|
| **ගිවිසුම්ගත සේවාවන්** | රුපි. | රුපි. |
| ප්‍රවාහනය | 1,205,818 | 1,548,631 |
| විදුලි සංදේශ | 25,597,740 | 19,133,787 |
| තැපැල් ගාස්තු | 713,718 | 1,198,143 |
| විදුලිය | 71,874,464 | 79,666,874 |
| ආරක්ෂණ සේවා | 13,664,310 | 11,538,217 |
| ජලය | 5,816,669 | 5,914,621 |
| පිරිසිදු කිරීමේ සේවා | 16,318,974 | 12,850,614 |
| කුලී සහ බදු ගාස්තු | 16,000 | 312,252 |
| වරිපනම් සහ බදු | 335,453 | 535,646 |
| මුද්‍රණ සහ ප්‍රචාරණ | 3,359,518 | 3,098,272 |
| වෙනත් | 1,625,680 | 1,338,015 |
| | **140,528,344** | **137,135,072** |

| සටහන 28 | 2012 | 2011 |
|---|---|---|
| **සැපයුම් සහ පරිභෝජන** | රුපි. | රුපි. |
| ලිපිද්‍රව්‍ය | 16,731,223 | 16,698,376 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 10,206,625 | 8,303,125 |
| යාන්ත්‍රික සහ විද්‍යුත් භාණ්ඩ | 2,258,823 | 2,228,955 |
| රසායන සහ වීදුරු භාණ්ඩ | 1,145,471 | 1,637,494 |
| වෙනත් සැපයුම් | 40,830,124 | 29,359,573 |
| | **71,172,266** | **58,227,523** |

| සටහන 29 | 2012 | 2011 |
|---|---|---|
| **නඩත්තු** | රුපි. | රුපි. |
| වාහන | 6,257,556 | 7,862,192 |
| පිරියත යන්ත්‍ර සහ උපකරණ | 17,752,976 | 13,896,089 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | - | 1,258,495 |
| ගෘහභාණ්ඩ | 1,380 | 32,578 |
| වෙනත් | 285,000 | 86,289 |
| | **24,296,912** | **23,135,643** |

| සටහන 30 | 2012 | 2011 |
|---|---|---|
| **මූල්‍ය පිරිවැය** | රුපි. | රුපි. |
| බැංකු ගාස්තු | **328,440** | **872,158** |

**මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන්**

| සටහන 31 | 2012 | 2011 |
|---|---|---|
| **මුදල් සහ මුදල් සමාන දෑ** | රුපි. | රුපි. |
| ආයෝජන (දිගු කාලීන) | 334,519,569 | 342,981,012 |
| ආයෝජන - නේවාසිකාගාර | 37,098 | 37,098 |
| බැංකු මුදල් | 68,567,549 | 123,979,511 |
| අතැති මුදල් | 1,486 | 1,446 |
| මුදල් සහ මුදල් සමාන දෑ | **403,125,702** | **466,999,067** |

**24.7 විගණකාධිපතිගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන වලට සටහන්**

EC/D/UM/FS/2012 2013 ඔක්තෝබර් 10

උපකුලපති,
මොරටුව විශ්වවිද්‍යාලය.

**මොරටුව විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

මොරටුව විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය, 108 සහ 111 වගන්ති සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2013 ජූනි 27 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම තක්සේරු කිරීම ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය පිළිබඳ ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 පරිච්ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්වාගණනය කළ මතය

---------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(a) සමාලෝචිත වර්ෂයේ මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 වන දින ඉදිරිපත් කර තිබුණි. ගිණුම් විගණනයෙන් පසුව 2013 ජුනි 27 වන දින මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව නිකුත් කරන ලදී. එම වාර්තාවෙන් රු. 642,339,107ක ගිණුම්කරණ අඩුපාඩු පෙන්වා දුන් අතර එම ගිණුම්කරණ අඩුපාඩුවලින් රු. 639,079,108 ක් නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ජුලි 09 වන දින ඉදිරිපත් කරන ලදී. තෝරාගන්නා ලද නියැදියෙන් බාහිරව තවදුරටත් මෙවැනි අඩුපාඩු තිබීම විගණනයේදී බැහැර කළ නොහැක.

(b) 2012 දෙසැම්බර් 31 දින වන විට ශුද්ධ වටිනාකම ශුන්‍ය අගයක් වන දැනට පාවිච්චි කරනු ලබන පිරිවැය රු. 1,620,484,835 ක් වූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

(c) 2012 වසරේ උපාධි ප්‍රදානෝත්සවය සඳහා වැය වූ සත්‍ය වියදම රු. 1,166,828 ක් වන අතර එය ගිණුම්වල දක්වා ඇත්තේ රු. 600,000 ක් ලෙස බැවින් උපාධි ප්‍රදානෝත්සවය සඳහා දැරූ සත්‍ය වියදම මූල්‍ය ප්‍රකාශන තුළ රු. 566,828 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(d) විභාග අංශයේ රාජකාරි ඉටුකිරීම සඳහා බාහිර නිලධාරීන් 04 දෙනෙකුට ගෙවා තිබූ රු. 260,000 ක වැටුප් අදාළ වියදම් ගිණුමට හර කිරීම වෙනුවට උපාධි ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයන්ගෙන් ලබාගෙන තිබූ ගාස්තුවලින් හිලව් කර තිබුණි.

(e) අවසන් ව තිබූ කෙටිකාලීන පාඨමාලා 16 ක්, ව්‍යාපෘති 04 ක් සහ වෙනත් පාඨමාලා 03 කට අදාලව රු. 4,889,207ක අතිරික්තය ඒ ඒ වර්ෂවල ආදායම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට විලම්භිත ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(f) 2011 වර්ෂයේ විලම්භිත ආදායම් ලෙස දක්වා තිබූ කෙටිකාලීන පාඨමාලා දෙකකට අදාළව රු. 28,440ක අතිරික්තය අදාළ වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කරනු වෙනුවට, විශ්වවිද්‍යාලය තුල පවත්වාගෙන යනු ලබන දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් ගිණුම්වලට මාරු කර තිබුණි.

## 2.2.2 නොසැසඳු පාලන ගිණුම්

-------------------------

සේවක ණය සහ අත්තිකාරම් වර්ග 04ක ලෙජර් ගිණුම් අනුව ශේෂය රු.59,874,216 ක් වූ අතර ඉදිරිපත් කර ඇති උපලේඛන අනුව එය රු. 59,799,257 ක් වූයෙන් රු.74,959ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(a) <u>ගිවිසුම් සහ බැඳුම්කර කඩ කිරීම</u>

(i) 2012 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් සහ බැඳුම්කර කඩකර තිබූ නිලධාරීන් 29 දෙනෙකුගෙන් රජයට අය විය යුතු රු. 37,980,031 ක ගිවිසුම් සහ බැඳුම්කර වටිනාකම අයකරගෙන නොතිබුණි.

(ii) ගිවිසුම් කඩකල නිලධාරීන් 10 දෙනෙකුගෙන් අය විය යුතු මුදලින් රු.1,646,291 ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අය කරගැනීමට අදාළ නිලධාරීන් විසින් එකඟතාවය පළකර තිබුණද, 2012 දෙසැම්බර් 31 වන විටත් එම මුදල අය කරගෙන නොතිබුණි.

(iii) ගිවිසුම් සහ බැඳුම්කර කඩකිරීමෙන් රු. 14,766,369ක් අය විය යුතුව ඇති නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට 2012 දෙසැම්බර් 31 වන විටත් කටයුතු නොකර ඇති අතර ඒ තුල නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු ගිවිසුම් හා බැඳුම්කර වටිනාකම රු.2,905,870ක් වසර 10 ඉක්මවා ඇති අතර එම මුදල් මේ දක්වා අය කරගෙන නොතිබුණි.

(b) ලැබිය යුතු ගිණුම්

(i) මොරටුව විශ්වවිද්‍යාලයේ ගෘහස්ථ ක්‍රීඩා පිටිය ඉදි කිරීම වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු. 4,435,700ක වටිනාකමක් ලැබිය යුතු ආදායම් ලෙස වර්ෂ 05ක සිට පැවතෙන අතර එම මුදල් මේ දක්වා අය කරගෙන නොතිබුණි.

(ii) නිලධාරීන් 21 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 609,875 ක සේවක ණය හා වැටුප් අත්තිකාරම්, 2005 වර්ෂයේ සිට අයවිය යුතු අතර එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබිණි.

(iii) 2009 සිට 2012 කාලපරිච්ඡේදය තුල නිලධාරීන්ට අවස්ථා 36ක් තුල ලබා දෙන ලද රු. 776,213 ක් වන සැපයුම් අත්තිකාරම් මුදල් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනයට සාක්ෂි හිඟ වීම**

(a) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් පහත වටිනාකම් තහවුරු වන විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුමේ නම | අගය<br>රු. |
|---|---|---|
| (i) | මහපොළ ශිෂ්‍යත්ව අරමුදල | 7,479,700 |
| (ii) | ලැබිය යුතු ශිෂ්‍යාධාර ගිණුම | 1,793,700 |
| (iii) | ශිෂ්‍යාධාර අත්තිකාරම් ගිණුම | 927,400 |
| | එකතුව | 10,200,800 |

(b) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය අනුව සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සේවය නියුක්ත සෑම තැනැත්තෙකුම පැමිණි වේලාව හා පිටව යන වේලාව පැමිණීමේ ලේඛනවල සටහන් කළ යුතු නමුත් අධ්‍යයන කාර්යමණ්ඩලය පැමිණීම හා පිටවීම අත්සන කර නොතිබුණි.

(c) 2011 වසර 2012 වර්ෂ කථිකාචාර්යවරුන් 11 දෙනෙකුට ගෙවූ පර්යේෂණ දීමනා රු.952,312ක් සම්බන්ධව අදාල පර්යේෂණ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(a) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 99 වන වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතන මගින් කුමන ප්‍රවාහයකින් හෝ අත්කර ගනු ලැබුවාවූ සියලු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතුය. එහෙත් විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු පහත වටිනාකම් විශ්වවිද්‍යාල අරමුදලට බැරකිරීමකින් තොරව ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වා තිබුණි.

| | | **වටිනාකම** **රු.** |
|---|---|---|
| (i) | උපාධි ප්‍රදානෝත්සවය සඳහා ශිෂ්‍යයන්ගෙන් ලබාගෙන තිබූ ගාස්තු | 3,351,960 |
| (ii) | යෝග්‍යතා පරීක්ෂණ ආදායම | 2,599,482 |
| (iii) | උපාධි ප්‍රදානෝත්සවය සඳහා රජයේ බැංකුවකින් ලද මුදල | 433,171 |
| (iv) | ප්‍රදර්ශනවලින් ලද ආධාර | 15,000 |
| | එකතුව | 6,399,613 |

(b) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ පිර්/1/174/1-2003 හා 2003 ජනවාරි 29 දිනැති දිනැති ලිපියෙන් දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු නමුත්, ඉන් බැහැරව උපදේශක සේවා සම්බන්ධව නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 380හි ප්‍රතිපාදනයට පටහැනි ලෙස 2012 වසර තුළදී පශ්චාත් උපාධි පාඨමාලා ආදායමෙන් රු. 3,789,789 ක්ද, කෙටිකාලීන පාඨමාලා

ආදායමෙන් රු. 186,075ක්ද, තොරතුරු තාක්ෂණ අධ්‍යයන පාඨමාලා (BIT) ආදායමින් රු. 5,723,063ක්ද, එම කටයුතුවලට සෘජු ලෙස දායක වූ බව තහවුරු නොවූ සේවකයන් අතර බෙදා හැර තිබුණි.

(b) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ අරමුණ වූයේ උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීම හා ඒවා පවත්වාගෙන යාම කළ යුතු වුවද, එකී පනතට පටහැනිව සහ කැබිනට් අනුමැතියකින්ද තොරව තොරතුරු තාක්ෂණ පාඨමාලාවේ (BIT) ආදායමින් රු.2,922,613ක විශ්වවිද්‍යාලයීය පරිශ්‍රය තුළ පවත්වා තිබූ පෞද්ගලික සමාගමකට කළමනාකරණ ගාස්තු වශයෙන් ගෙවීම් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගණන් ගැනීමට පෙර රු. 1,006,538,671 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු.906,178,865 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලද රු. 942,131,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 64,407,671ක් දක්වා අඩු වී තිබුණු අතර, ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු. 874,066,000 ක් වූ රජයේ ප්‍රදාන ගණන් ගැනීමෙන් පසුව එම වර්ෂයේ ඌනතාවය රු. 32,112,865 දක්වා අඩු වී තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 32,294,806ක පිරිහීමක් ඇති වීම කෙරෙහි කාර්ය මණ්ඩල පාරිශ්‍රමික රු. 70,154,279 කින් වැඩි වීම සහ ක්ෂය කිරීම් රු. 33,383,794 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබිණි.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------------

#### 3.2.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

-----------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ උද්ධෘතයන් පසුගිය වර්ෂයට සාපේක්ෂව පහත දැක්වේ.

| විෂයය | 2012 | 2011 | වෙනස්වීමේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|
| | රු. | රු. | |
| ආදායම | 1,375,381,862 | 1,275,194,843 | 7.86 |
| වියදම | 1,439,789,533 | 1,307,307,708 | 10.13 |
| ඌනතාවය | 64,407,671 | 32,112,865 | 100.57 |

### 3.2.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ උද්ධෘතයන් පසුගිය වර්ෂයට සාපේක්ෂව පහත දැක්වේ.

| විෂයය | 2012 | 2011 | වෙනස්වීමේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|
| | රු. | රු. | |
| **ජංගම නොවන වත්කම්** | 2,588,143,381 | 2,420,392,952 | 6.93 |
| **ජංගම වත්කම්** | 238,864,154 | 264,805,017 | (9.80) |
| **ජංගම වගකීම්** | 502,957,555 | 414,806,519 | 21.25 |
| **ප්‍රාග්ධනය හා සංචිත** | 1,951,019,692 | 1,920,271,619 | 1.6 |
| **අරමුදල්** | 373,030,289 | 350,119,831 | 6.54 |

### 3.2.3 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

---------------------

සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ උද්ධෘතයන් පසුගිය වර්ෂයට සාපේක්ෂව පහත දැක්වේ.

| විෂයය | 2012 | 2011 | වෙනස්වීමේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|
| | රු. | රු. | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (104,552,306) | 26,020,068 | (501) |
| ආයෝජන **ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (422,657,023) | (273,592,925) | (54) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින්** ජනනය වූ **ශුද්ධ මුදල් ප්‍රවාහය** | 358,783,659 | 523,401,637 | ( 31) |
| **ආරම්භක මුදල් සහ මුදල් හා සමාන දෑ** | 466,999,067 | 217,190,356 | 115 |
| **අවසාන මුදල් සහ මුදල් හා සමාන දෑ** | 403,125,702 | 466,999,067 | (14) |

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 4.1 කාර්යසාධනය

----------------

2012 වර්ෂයේ විශ්වවිද්‍යාලය තුල ඒ ඒ පීඨවල සිටි අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ එක් ඒ ඒ පීඨයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ පහත දැක්වේ.

| | ඉංජිනේරු පීඨය | තොරතුරු තාක්ෂණ පීඨය | වාස්තු විද්‍යා පීඨය |
|---|---|---|---|
| ස්ථිර කථිකාචාර්යවරු සංඛ්‍යාව | 175 | 21 | 52 |
| රැඳී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 3169 | 544 | 1185 |
| එක් කථිකාචාර්යවරයෙකු සඳහා වූ සාමාන්‍ය ශිෂ්‍ය සංඛ්‍යාව | 18 | 26 | 23 |

(a) 2009, 2010 2011 වර්ෂවල පිළිවෙලින් ශිෂ්‍යයින් 1187, 1244 සහ 1355 ක් බඳවාගෙන තිබුණු අතර 2012 වර්ෂයෙදි ශිෂ්‍යයින් විශ්වවිද්‍යාලයට බඳවා නොගැනිම හේතුවෙන් විශ්වවිද්‍යාලය සතු භෞතික හා මානව සම්පත් එම කාලය තුල ඵලදායක ලෙස යොදාගත් බවට තහවුරු වි නොතිබිණි. 2011 වර්ෂයට අදාල අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සහ ඉසෙඩ්කෝ (Z-core) ලකුණු සහ කඩයිම් ලකුණු නිකුත් කිරිම සම්බන්ධව ඇතිව තිබූ අධිකරණ ක්‍රියාමාර්ගයන් හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුව ඇති බව උපකුලපතිවරයා දන්වා ඇත.

(b) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම රු. 1,189,716,451 ක් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4898 ක් වූයෙන් එක් ශිෂ්‍ය පිරිවැය රු. 242,898 ක් විය. එය පසුගිය වර්ෂය හා සැසඳීමේදී පුනරාවර්තන වියදම 1,060,745,047 ක් හා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 4929 විමෙන් එක් ශිෂ්‍ය පිරිවැය රු. 215,205 ක් වි තිබුණි.

(c) සමාලෝචිත වර්ෂය තුළ "මහපොළ ශිෂ්‍යත්ව අධාර" වශයෙන් ශිෂ්‍යයින් 2548 දෙනෙකුට, රු. 5,736,500ක් ගෙවා තිබූ අතර ශිෂ්‍යාධාර වශයෙන් ශිෂ්‍යයින් 3668 කට රු. 3,138,900 ක් ගෙවා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(a) විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995 ජූලි 14 දිනැති හා අංක 636 දරන චක්‍රලේඛය අනුව විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර විභාගයන් පවත්වා මාස 03ක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද, 2011සහ 2012 වර්ෂවල පැවැත්වූ විභාගවල ප්‍රතිඵල නිකුත් කිරිම මාස 04 සිට මාස 21 දක්වා ප්‍රමාද වූ අවස්ථා 51 නිරික්ෂණය විය.

(ii) ඇතැම් උපාධි පාඨමාලාවල පළමු වාරයේ ප්‍රතිඵල නිකුත් කිරිමට ගතකර ඇති කාලය එම පාඨමාලාවට අදාල සිසුන්ගේ දෙවන වරයේ විභාගය පැවත්වූ දිනයෙන් පසු දිනයක් දක්වාම ප්‍රමාද වූ අවස්ථා 07 ක් නිරික්ෂණය කෙරුණි.

(b) පර්යේෂණ දීමනා ගෙවීම

(i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 1/2011 හා 2011 අප්‍රේල් 20 දිනැති චක්‍රලේඛයේ 03 වන ඡේදය අනුව පර්යේෂණ කටයුතු, පර්යේෂණ දීමනාවට හිමිකම් ලබන වසරට අදාලව සක්‍රියව සිදුකරමින් පැවතිය යුතු වුවත් කථිකාචාර්යවරු 18 දෙනෙකු විසින් 2011 වර්ෂය වෙනුවෙන් පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර තිබූ නමුත් එම පර්යේෂණ සක්‍රියව සිදුකරන බවට හෝ ඒවා සම්භාෂණයක පළකර තිබූ බවට සාක්ෂි නොතිබුණි.

(ii) පර්යේෂණ කමිටුවට ඉදිරිපත්කර අනුමැතිය ලබාගැනීමෙන් පසු අදාළ වර්ෂය වෙනුවෙන් පර්යේෂණ දීමනාව ලබාගත යුතු නමුත්, කථිකාචාර්යවරු 05 දෙනෙකු විසින් ඉදිරිපත් කර ඇති පර්යේෂණ යෝජනා සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබියදී ඔවුන් වෙනුවෙන් 2012 වර්ෂයේ පර්යේෂණ දිමානා වශයන් රු. 379,316 ක් ගෙවිම් කර තිබුණි.

(c) විශ්වවිද්‍යාලයට අයත් දේපළ 06 ක් සම්බන්ධයෙන් වරිපනම් බදු ගෙවීම් කරනු ලබන්නේ පෙර අයිතිකරුගේ නමිනි. අයිතිය වෙනස්විම පළාත් පාලන ආයතනයට දැනුම් දී මෙම දේපල විශ්වවිද්‍යාලයට පවරා වරිපනම් බදු ගෙවිම විශ්වවිද්‍යාලය නමින් කළයුතු වුවත් වර්ෂ කිහිපයක සිටම මෙම කටයුතු සිදුකර නොතිබුණි.

(d) විශ්වවිද්‍යාලයේ දේශන ශාලාවට අවශ්‍ය පුටු 375ක් සෑදීම සඳහා 2010 වර්ෂයේදි රු. 1,189,500 ක දැව තොගයක් මිලදි ගෙන කර්මාන්ත ශාලාව වෙත ලබාදි තිබුණද ඉන් පුටු 125 ක් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් විශ්වවිද්‍යාලයට භාර දී නොතිබුණි.

(e) විශ්වවිද්‍යාලයට අයත් වාහනයක් 2010 අප්‍රේල් 29 වන දින අනතුරකට භාජනය වි තිබුණු අතර වාහනය අළුත්වැඩියා කිරිමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටද විශ්ව විද්‍යාල භූමියේ ගාල් කර තිබුණි මෙම වාහනය අනතුරකට භාජනය විම නිසා විශ්වවිද්‍යාලයට සිදුවු අලාභය රු 235850 ක් අදාල රක්ෂණ ආයතනයෙන් සාමාලෝචිත  වර්ෂය අවසාන වන විටද ප්‍රතිපුර්ණය කරගෙන නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරන ලදී.

(a) 2012 දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරිම වෙනුවෙන් පිහිටුවා ඇති අරමුදල් 68ක රු.11,997,582 ක ශේෂය ගිණුම්වල දක්වා ඇති අතර සමාලෝචිත වර්ෂය තුල මෙම අරමුදලින් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමට කටයුතු කර නොතිබුණි.

(b) ශිෂ්‍යත්ව ප්‍රදානය කිරිම වෙනුවෙන් පිහිටුවා ඇති අරමුදල 32ක සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.4,554,617ක ශේෂයක් තිබුණද, පසුගිය වර්ෂ 05 තුල කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමිමට කටයුතු කර නොතිබුණි.

(c) උපදේශක සේවා සංචිත අරමුදල් වෙනුවෙන් පිහිටුවා ඇති බැංකු ජංගම ගිණුමේ රු. 33,204,762 ක පමණ සාමාන්‍ය මුදල් ප්‍රමාණයක්, සෑම මාසයකදීම පැවති අතර එම මුදල් ශේෂයන් වඩාත් ඵලදායි කෙටිකාලීන අයෝජන මාර්ගයක අයෝජනය කිරිමට හැකියාව තිබියදි ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

**4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

-----------------------------------

මොරටුව විශ්වවිද්‍යාලය පිහිටි අක්කර 55ක ඉඩම මොරටුව විශ්වවිද්‍යාලයේ නමට, මේ දක්වා පවරාගෙන නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලය හා අනෙකුත් කාර්යමණ්ඩල විස්තර පහත දැක්වේ.

(a) <u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

| | | අනුමත සංඛ්‍යාව | සත්‍ය සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | කථිකාචාර්යවරුන් | 410 | 146 | - | 264 |
| (ii) | මහාචාර්යවරුන් | 36 | 50 | 14 | - |

(b) <u>අනෙකුත් කාර්ය මණ්ඩලය</u>

| | | අනුමත සංඛ්‍යාව | සත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 32 | 23 | 09 |
| (ii) | මාණ්ඩලික නොවන | 701 | 539 | 162 |

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

-------------------

2012 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භ කිරිමට බලාපොරොත්තු වූ පශ්චාත් උපාධි පාඨමාලා 04ක් පැවත්වීමට කටයුතු කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ 2012 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන වැඩසටහනට අනුව විෂයයන් 22ක් යටතේ පරීක්ෂාවන් සිදුකිරීමට සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේ විගණනය සිදුකර ඇත්තේ විෂයයන් 11 ක් සඳහා පමණි. මේ අනුව ඉතිරි විෂයයන් 11 සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2013 වර්ෂයේ ජූනි මාසය අවසන් වන විටත් පාර්ලිමේන්තුවෙහි සභාගත කර නොතිබිණි.

## 6. පද්ධති සහ පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(a) අත්තිකාරම් ගෙවීම සහ පියවීම
(b) ණය අය කිරීම
(c) පශ්චාත් උපාධි පාඨමාලා ආදායම්
(d) ගිණුම්කරණය
(e) ගිවිසුම් පාලනය
(f) පර්යේෂණ දීමනා පාලනය
(g) ගබඩා පාලනය
(h) අයවැය පාලනය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

දුරකථන අංක
தொலைபேசி இல
Telephone Nos.

උප කුලපති
உப வேந்தர்
Vice-Chancellor 2651259

කාර්යාලය
காரியாலயம்
Office 2650301, 2650340, 2650185, 2650188, 2650286, 2650287

Fax No 2650622


# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# மொறட்டுவைப் பல்கலைக்கழகம், இலங்கை
# UNIVERSITY OF MORATUWA, SRI LANKA


මගේ අංකය
எனது இல
My No. මුසැ/08

ඔබේ අංකය
உமது இல
Your No.

මොරටුව
மொறட்டுவை
Moratuwa


දිනය
திகதி
Date 2013.10.21

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

**<u>මොරටුව විශ්වවිද්‍යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ හා සම්බන්ධව ඔබගේ අංක CE/D/UM/FS/2012 හා 2013.10.10 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.

දක්වා ඇති කරුණු සම්බන්ධව විශ්වවිද්‍යාලය මගින් මේ වනවිට ගෙන ඇති සහ ගැනීමට අදහස් කරනු ලබන ක්‍රියාමාර්ග සහ පියවරයන් හා උක්ත විගණකාධිපති වාර්තාව සම්බන්ධ නිරීක්ෂණයන් පහත දක්වමි.

**2 මූල්‍ය ප්‍රකාශන**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) දක්වා ඇති සියලුම දෝෂ නිවරදි කර ඇත. ඉදිරියේදි මෙවැනි දෝෂයන් ඇති නොවීමට අවශ්‍ය කටයුතු කර ඇත.

(ආ) විශ්වවිද්‍යාලයේ ඇති සියලුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යගණන කටයුතු තක්සෙරු දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත.

(ඇ), 2012 වර්ෂයේ උපාධි ප්‍රධානෝත්සව සඳහා ඇස්තමේන්තුගත වියදම් සම්බන්ධ රජයේ අරමුදල් වලට වැඩි වැය බරක් නොවීම සඳහා ලංකා බැංකුවෙන් අනුග්‍රාහකත්වය ලබාගන්නා ලද අතර වාර්ෂික අයවැය ලේඛනය මගින් වෙන්කරන ලද ප්‍රතිපාදන වලට වඩා වැඩි වියදම් එම අනුග්‍රාහක මුදල් වලින් පියවීමට කටයුතු කරන ලදී. මෙය හුදෙක් රජයේ වැය බර අඩුකර ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයක ප්‍රතිඵලයක් බවද දන්වමි. අදාළ ඉතිරි අනුග්‍රාහක

මුදල් ඉදිරියේදී ඇතිවන උපාධි ප්‍රධානෝත්සව වියදම් අවශ්‍යතාවයන් වෙනුවෙන් රඳවා ඇති බව තවදුරටත් දන්වමි.

(ඈ), විභාග අංශයේ පවතින කාර්ය මණ්ඩල ඌණතාවය නිසා නියමිත දිනට උපාධි ප්‍රදනෝත්සවය පැවැත්වීමට කටයුතු කිරීම අවශ්‍ය බැවින් මෙම බාහිර සේවා ගෙවීම් මත සේවකයන් යොද ගන්නා ලදී. ඒ සදහා අදල ප්‍රතිපාදන උපාධි ප්‍රදනෝත්සව සඳහා ලබාගන්නා ලද මුදල් වලින් වෙන්කර ගෙවීම් සිදුකර ඇත. මෙම පරිපාලන අංශවල කාර්ය මණ්ඩල පහසුකම් වැඩි කිරීම මෑත කාලයතුල සිදුවී නොමැති අතර සපයන සේවාවන් එම කාලයට වඩා කිහිප ගුණයකින් වැඩිවීම මත විකල්ප පියවරක් වශයෙන් හා විශ්වවිද්‍යාලයේ කටයුතු ක්‍රමවත්ව කරගෙන යාම සඳහා මෙම පියවර ගෙන ඇති බව දන්වමි.

**(ඊ) <u>කෙටිකාලීන පාඨමාලා ව්‍යාපෘති ගිණුම් සහ වෙනත් පාඨමාලා</u>**

දක්වා ඇති කෙටිකාලීන පාඨමාලා 16 , ව්‍යාපෘති සම්බන්ධ ගිණුම් 4 සහ වෙනත් පාඨමාලා සම්බන්ධ ගිණුම් 3 ට අදාලව ගිණුම් කටයුතු අවසන් නොවීම මත මෙම ගිණුම් ශේෂයන් ඉදිරියේදී ගෙවීමට ඇති බැරකමක් බැවින් විලම්භිත ආදයම් ලෙස ගිනුම් ගත කර ඇත. මෙම ක්‍රමවේදය 2006 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබන ක්‍රමය වන අතර එසේ පවත්වාගෙන යනු ලබන ගිණුම් වර්ෂ 03 ක කාලයක් අක්‍රියව පවතී නම් එම පාඨමාලා / ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ ලබාගෙන ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ලැබේ.

(උ) දක්වා ඇති ගිණුම් ශේෂයන්ට අදල රු. 28,440 ක මුදල එම ව්‍යාපෘති / පාඨමාලා සම්බන්ධීකාරකවරුන්ගේ නිර්දේශ ලබාගෙන ගිණුම් වසා දැමීමට කටයුතු කර ඇති අතර විශ්වවිද්‍යාලයේ සංවර්ධන අරමුදල් වලට ආදයමට ගෙන ඇත. ඒ අනුව එම මුදල් විශ්වවිද්‍යාලයේ සංවර්ධන කටයුතු වලට අදලව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කර ඇති කාර්යයන් සඳහා යොද ගනු ලැබේ.

### 2.2.2 නොසැසඳුනු පාලන ගිණුම්

| | | | |
|---|---|---|---|
| (අ) | 1 | වැටුප් අත්තිකාරම් | රු 600.00 |
| | 2 | ආපද ණය අත්තිකාරම් | රු 9882.95 |
| | 3 | මාණ්ඩලික ණය අත්තිකාරම් | රු 5376.00 |
| | 4 | උත්සව අත්තිකාරම් | රු 4700.00 |
| | 5 | විශේෂ අත්තිකාරම් | රු 500.00 |

1997 – 2010 වර්ෂවලට අදල ඉහත ශේෂයන් හැර ඉතිරිය නිවරදි කර ඇත. ඉහත වෙනස්කම්ද සොයා නිවරදි කිරීමට කටයුතු කරමින් පවතී.

2.2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම**

1 දැනට මුළු අයවිය යුතු මුදල රු. 37,980,031 ක අයකිරීම් සම්බන්ධ අර්ථ සාධක අරමුදලින් අයකරගතහැකි මුදල් අයකර ගැනීමටත් අනෙකුත් මුදල් නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට කටයුතු යොදා ඇත.

11 විවිධ හේතුමත අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ ප්‍රායෝගික ගැටළු නිසා මෙම අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම ප්‍රමාද වීම මෙයට හේතුවී ඇත. එම ගැටළු නිරාකරණය කර ගැනීමෙන් පසු අදාල අර්ථසාධක අරමුදල් වලින් අයකර ගැනීම සිදුකරනු ලැබේ.

111 නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව පුද්ගල් මහතාට විරුද්ධව නීතිමය කියමාර්ග ගැනීමට නොහැකි අතර අනිකුත් ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු මුදල් වලින් අර්ථසාධක අරමුදලින් අයකරගත හැකි මුදල් අයකර ගැනීමටත් අනෙකුත් මුදල් නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට කටයුතු යොදා ඇති බව දන්වමි.

(ආ) **ලැබිය යුතු ගිණුම්**

i විශ්වවිද්‍යාල ගෘහස්ථ ක්‍රීඩාගාරය ඉදිරිකිරීම සඳහා ලැබිය යුතු මෙම මුදල ක්‍රීඩා අමාත්‍යාංශය වෙතින් ලබාගැනීම සඳහා 2002 වසරේ සිට උත්සාහගෙන ඇත. එහෙත් එම මුදල් මෙතෙක් ප්‍රතිපූරනය කර නොමැති අතර අදාල ලිපි ලේඛන වර්ථමාන කීඩා අමාත්‍යාංශය සතුව නොමැති වීම හා ප්‍රතිපාදන නොමැති බැවින් ප්‍රතිපූර්ණය කල නොහැකි බව දක්වා ඇත. ඒ අනුව මේ සම්බන්ධයෙන් 2013.10.03 පැවති පාලක සභාවට වාර්තා කරන ලදුව මහා භාණ්ඩාගාරයේ අනුමතිය මත මෙම ලැබිය යුතු මුදල පොත්වලින් කපා හැරීම අනුමත කර ඇත.

**ii** මේ වනවිට ඇති සේවක ණය අය කිරීම් වලට අවශ්‍ය සියළුම කටයුතු කර ඇත.ඒ අනුව දැනට සේවයෙන් ඉවත්ව ඇති අයගෙන් අයවිය යුතු ශේෂයන් අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී අයකර ගැනීමටත් වෙනත් විශ්වවිද්‍යාල වලින් අයවිය යුතු ශේෂයන් ගෙන්වා ගැනීමටත් කටයුතු කර ඇත. දැනට අය කිරීමට ඇති ශේෂය රු 433,635 කි.

**iii** අදාල නොපියවූ සැපයීම් අත්තිකාරම් ශේෂයන් ගෙන් රු. 12,500.00 අත්තිකාරම් ශේෂයන් හැර ඉතිරිය පියවීමට කටයුතු කර ඇති අතර එම ශේෂයට අදාල ලියකියවිලි ලබාගෙන අත්තිකාරම් ඉක්මනින් පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් දී ඇත.

2.2.4 **විගණනයට සාක්ෂි නොවීම**

(අ) (i) මෙම ශේෂය වර්ෂ ගණනාවක සිට එකතු වී පවතින ගිනුම් ශේෂයකි. විශ්වවිද්‍යාලය මගින්
ගෙවන ලද මහපොළ අත්තිකාරම් සඳහා ලැබී ඇති මුදල් ගිනුම්ගත කර ඇත. ඒ අනුව මෙම මුදල් ශේෂයන් පිළිබඳව විස්තරාත්මකව පරීක්ෂා කොට අදාල ගැලපීම් කිරීමට කටයුතු යොදා ඇත.

(ii) මෙම මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතින් ලැබිය යුතු ශේෂයක් වන අතර

එම මුදල් ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා ඇත.

(iii) මහපොළ සහ ශිෂ්‍යාධාර වශයෙන්. නිශ්චිතව හඳුනාගන්නා තුරු තාවකාලිකව ගෙවනු ලබන අත්තිකාරම් මෙම ගිණුම මගින් නිරූපනය වන අතර අදාල ගැලපීම් කිරීමෙන් පසු ගිණුම් තුලනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය පැය 8 ක කාලයක කාර්යාල කටයුතු ඉටු කරනු ලබන සේවක කොට්ඨාශයක් නොවන අතර ඉගෙනුම්, පර්යේෂණ, නව නිපයුම්, ජාතික වශයෙන් වැදගත් කාර්යයන්හි නිරතවීම ඇදී විශේෂිත කාර්යන්ට දායකත්වය සපයන කාර්ය මණ්ඩලයක් වන අතර එම කාර්යයන් පොත්වල පැමිණීම සහ පිටවීම සටහන් කිරීම මගින් සීමා කිරීම් වලට යටත් කිරීමෙන් ඵලදායී සේවාවක් ලබා ගැනීම ඉතාමත් අසීරු බව පෙන්වා දෙමි. තවද දැනට පවතින තත්ත්වයන් මතද අධ්‍යයන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලයෙන් අස් නොවී රදවා ගැනීම ඉතාමත් අසීරු කාර්යයක්ව පවතින වාතාවරනයක් තුල තව තවත් සීමා පැනවීම් මගින් දැනට සිටින කාර්ය මණ්ඩලයද රදවා ගැනීම පිළිබද ගැටලු ඇතිවිය හැකි බවද දන්වමි. එසේ වුවද මාසික වැටුප් ගෙවීමේදී සෑම අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේම සේවයට පැමිණීම පිළිබද වාර්තා අධ්‍යනාංශ සහ අංශ ප්‍රධානීන්ගෙන් ලබා ගෙන සේවයට පැමිණීම පිළිබද තහවුරුවක් ලබා ගන්නා බවත් ඔවුන්ගෙන් ලැබිය යුතු සේවාව අධ්‍යාපනික වැඩ පැවරීම හා වැඩ කිරීම ( Academic work load verification ) මගින්ද අංශ ප්‍රධානීන් තහවුරු කර ගන්නා බව දන්වමි.

(ඇ) දක්වා ඇති අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 11 විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා ආදිය අඩංගු ලිපිගොනු අධ්‍යයන හා ප්‍රකාශන අංශයේ පවතින කාර්ය මණ්ඩල ඌනතාවය මත වෙන වෙනම සකස් කර නොමැති වීම නිසා ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය. දැනට ලිපිගොනු සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

2.2.5 <u>නීති,රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

(අ) විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත මෙම අයකිරීම් සිදුකරනු ලබන අතර ඒ අනුව අවශ්‍ය කාර්යයන් සදහා වන වියදම් රාජ්‍ය ප්‍රදාන වලට වැය බරක් නොවන ආකාරයට යොදා ගැනීමට මෙම මුදල් යොදා ගන්නා අතර සියලුම මුදල් විශ්වවිද්‍යාල ගිණුමට බැරකර ඇති බවද දන්වමි.

(ආ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 29 (ඇ) වගන්තිය අනුව විශ්වවිද්‍යාල බලතල යටතේ විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධි පාඨමාලා පවත්වනු ලබන ආකාරය තීරණය කිරීම විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සිදුවිය යුතු බව දැක්වේ. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පශ්චාත් උපාධි පාඨමාලා /කෙටිකාලීන පාඨමාලා පැවැත්වීම/ගාස්තු අයකිරීම සහ එම ආදායම වියදම් බෙදී යන ආකාරය තීරණය කිරීම ඇතුළු සියළු කාර්යයන් සම්බන්ධව ගතයුතු ක්‍රියාවලියක් / ක්‍රමවේදයක්, එම පාඨමාලා ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ප්‍රායෝගික කරුණු සලකා බලා අනුමත කර ඇත. ඒ අනුව එම අනුමත ක්‍රමවේදය මත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙතද මෙම ගෙවීම් සිදුකර ඇත.

**(ඇ)** මොරටුව විශ්වවිද්‍යාලයේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකය මගින් පවත්වනු ලබන මෙම බාහිර උපාධි

පාඨමාලාවේ කටයුතු සදහා කාරය මණ්ඩල පහසුකම් විශ්වවිද්‍යාලය මගින් ලබා නොදෙන අතර ඒසදහා අවශ්‍ය ශ්‍රම දයකත්වය අදල සමාගම වෙතින් ලබා ගැනීම වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු මෙයට අදලවේ. ඉදිරියේදී මෙම කටයුතු සදහා කාරය මණ්ඩල පහසුකම් ලබාදීමෙන් පසු මෙම සේවා ලබා ගැනීම අත්හිටවනු ලැබේ.

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිපල**

විශ්වවිද්‍යාලීය කාර්ය මණ්ඩල පාරිශ්‍රමිකයන්ට අදලව වැටුප් හා වේතන, ජීවන වියදම් දීමනා, අධ්‍යයන දීමනා ආදිය වැඩිවීම හා කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම මත ඇතිවූ ගෙවීම් සදහා අමතර ප්‍රතිපාදන නොලැබීමත්, ස්ථාවර වත්කම් ක්ෂය වෙන් කිරීම් සදහා ප්‍රතිපාදන නොලැබීමත්, වෙනත් වියදම් වලට අදල සේවා සහ භාණ්ඩ මිළදී ගැනීම් වලට අදල මිළ ගණන් වැඩිවීම ආදි පාලනය කල නොහැකි හේතු මත සිදුවීම නිසා මෙම **ඌනතාවය සිදුවී ඇත.**

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

**3.2.1 මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශනය**

**ඉහත 3.1 හි පිළිතුර අදලවේ.**

**3.2.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

**වර්ෂයේ ගනුදෙනු සහ ක්‍රියාකාරකම් වල ප්‍රතිපලයක් ලෙස මෙම වෙනස්වීම් සිදුවේ.**

**3.2.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**වර්ෂයේ ගනුදෙනු සහ ක්‍රියාකාරකම් වල ප්‍රතිපලයක් ලෙස මෙම වෙනස්වීම් සිදුවේ.**

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

(අ) ශිෂ්‍යයන් බදවා ගැනීම සිදුකරනුයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වන අතර 2011 වර්ෂයට අදල අ.පො. ස (උ.පෙ) ප්‍රතිඵල සහ Z core ලකුණු සහ කඩයිම් ලකුණු නිකුත් කිරීම සමබන්ධව ඇතිව තිබූ අධිකරණ ක්‍රියාමාර්ගයන් හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුව ඇත.

**(ආ) වර්ෂයේ ගනුදෙනු සහ ක්‍රියාකාරකම් වල ප්‍රතිපලයක් ලෙස මෙම වෙනස්වීම් සිදුවේ.**

**(ඇ)** සියලුම සුදුසුකම් ලබන ශිෂ්‍යයන් සදහා ශිෂ්‍යාධාර හා මහපොල ගෙවීම් කරනු ලැබේ.

**4.2 කලමණාකරණ අකාරයක්ෂමතා**

(අ) **විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය**

I,II විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 636 අනුව විශ්වවිද්‍යාලවල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 03ක් ඇතුලත අනිවාර්යයෙන්ම සිදුකල යුතු බවට දන්වා නොමැති අතර මාස 03 ක කාලය තුල ප්‍රතිඵල නිකුත් කරන ලෙස කරන ලද ඉල්ලීමක් පමණක් වන බවද දන්වමි.

කෙසේ වුවද සියලුම විභාග ප්‍රතිඵල නිකුත් කිරීම මාස 03ක් තුල සිදුකිරීමට අවශ්‍ය උපදෙස් දී ඇති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවරයන්ද ක්‍රියාත්මක කර ඇත.

කෙසේ වුවද 2012 වර්ෂයට අදල විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විභාග ප්‍රතිඵල නිකුත් කිරීම පහත සදහන් නොවැළැක්විය හැකි හා අනපේක්ෂිත තත්ත්වයන් මත සිදුවුවක් බවද දන්වමි.

1 විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල ඌණතාවය මෙයට අදලව බලපාන ප්‍රධානතම හේතුව වන අතර වැටුප් තත්වයන් හා වෙනත් සේවා පහසුකම් අවම වීම මත අධ්‍යයන තනතුරු සදහා ඉල්ලුම් කරන්නන් නොමැති වීමද නව කාර්ය මණ්ඩල බදවා ගැනීම් වලට ඉමහත් බාදවක් වී ඇත.

2 2012 වර්ෂයේ ජුලි මස සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුල පැවති අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල වෘත්තීය සමිති ක්‍රියාමාර්ග හේතුවෙන් විභාග නියමිත පරිදි පැවැත්වීමට නොහැකි වීම හා පිළිතුරු පත් පරික්ෂා කිරීම් සිදු නොවීමත් සමහර විභාග 2013 වර්ෂයේ පැවැත්වීමටත් සිදුවීම.

3 සමහර විෂයයන් වලට අදල ශාස්ත්‍රීය නිබන්ධන කොටස් බාහිර පාර්ශව මගින් පරික්ෂා කරනු ලබන බැවින් වර්ථමාන ශිෂ්‍ය සංඛ්‍යාව අනුව ඒ සදහා වැඩිපුර කාලයක් ගතවීම.

**(ආ) පර්යේෂණ දීමනා ගෙවීම**

**i** විශ්වවිද්‍යාලය මගින් පර්යේෂණ දීමනා ගෙවීම් කිරීමේදී ඒ හා සම්බන්ධ චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කර ඇත. දැනට පර්යේෂණ දීමනා ගෙවීම් කරනු ලබනුයේ සක්‍රියව පර්යේෂණ කටයුතුවල නියැලෙන කාර්ය මණ්ඩලයට පමනක් වන අතර සුදුසුකම් නොලබන අයකු වෙත ගෙවීම් කර ඇත්නම් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලැබේ. යම් අයෙකු සේවයෙන් ඉවත්ව ගොස් ඇත්නම් අර්ථසාධක අරමුදල් මගින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**ii** දක්වා ඇති අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් අදළ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරනු ලදුව අනුමැතිය ලබාදී ඇති අතර අදල ලිපිගොනු ඉදිරිපත් කර ඇත. මෙම පර්යේෂණ දීමනා තවදුරටත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේදයක් සනාතන සභාව සහ පාලක සභාව අනුමත කර ක්‍රියාත්මකවේ.

**(ඇ)** 2013.03.11 දිනැති ලිපිය මගින් වරිපනම් බදු විශ්වවිද්‍යාලය නමින් ගෙවීමට කටයුතු සලස්වා ගැනීම සම්බන්ධයෙන් මොරටුව නගර සභාව වෙත අප කල ඉල්ලීමට අනුව, වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීම සදහා ඔප්පු සාරාංශ අදල අයදුම්පතක් සමග ඉදිරිපත් කරන ලෙස විශ්වවිද්‍යාලය වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව අදල අයදුම්පතක් ලබාගෙන අදල සාරාංශ සමග එය සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම සදහා විශ්වවිද්‍යාලයේ නීති නිලධාරිනිය වෙත ඉදිරිපත් කර ඇත.

(ඈ) මෙම පුටු සෑදීමේ කාර්යය ඉටු කරනුයේ එදිනෙද සාමාන්‍ය පරිදි පැවරෙන කටයුතු වලට අමතරව සිදු කරනු ලබන කාර්යයක් ලෙසින් බව දන්වමි. 2011

වසර වනවිට පුටු 250 ක් මූලික අවශ්‍යතාවයන් සදහා සකස් කර ලබාදී ඇති අතර කර්මාන්තශාලාව සදහා ඇති සීමිත සම්පත් භාවිත කරමින් අනිකුත් අධ්‍යයන කටයුතු වලට අදාල කාර්යයන් ද ඉටු කරමින් මෙම කාර්යය කරගෙන යනු ලබයි. දැනට සියලුම පුටු වල වැඩ අවසන් කර භාරදීමට කටයුතු කර ඇත.

(ඉ) අංක 52-1943 දරණ වාහනය 2013.06.05 දිනැති 387/02 දරන පාලක සභා තීරණය අනුව වාහනය අළුත්වැඩියාව සිදුකර ඇති අතර එම අළුත්වැඩියාවෙන් පසු ඉදිරිපත් කරන ලද බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අදාල රක්ෂණ සමාගම වෙත යොමු කර ඇත.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

(අ)(අ) ශිෂ්‍යත්ව පිරිනැමීම සිදුකරනුයේ අදාල ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා අරමුදල් ලබාදෙන පුද්ගලයාගෙන් හෝ ආයතන මගින් දන්වා ඇති නිර්නායකයන්ට අනුව සුදුසුකම් ලබන සිසුන් සඳහා වන අතර,එවැනි ශිෂ්‍යත්ව ලැබීමට සුදුසු සිසුන් නොසිටින්නේනම් ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු නොකෙරේ. ඒ අනුව මෙම ශිෂ්‍යත්ව අරමුදල් වලින් අවශ්‍ය අවස්ථා වලදී අදල ශිෂ්‍යත්ව ප්‍රදානයන් සිදුකරයි.

**(ඇ)** 2012 සැප්තැම්බර් මස සිට මෙම ගිණුමට අදල මුදල් ශේෂයෙන් රුපියල් මිලියන් 40 ක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර ඇති අතර ඉතිරි ශේෂය දැනට දෛනිකව REPO යටතේ ආයෝජනය කරනු ලබයි.

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්

මොරටුව විශ්වවිද්‍යාලය පිහිටි ඉඩම විශ්වවිද්‍යාලය වෙත පවරා දීම සඳහා මොරටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය මගින් කටයුතු කරමින් ඇත. මෙම කටයුතු කඩිනමින් කිරීම සඳහා ඒ සම්බන්ධ දැනුම සහ පළපුරුද්ද ඇති අයෙකුගේ සහය ලබා ගැනීමට අප උත්සාහ කලද එය ව්‍යර්ථ විය. එසේ වුවත් අප ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය මගින් මෙම කර්තව්‍ය සිදු කරවා ගැනීමට අවශ්‍ය විශ්වවිද්‍යාලයෙන් සිදුවිය යුතු කටයුතු සියල්ල සලසා ඇත.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

**(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලය**

පවතින බදවාගැනීමේ හා උසස්වීම් පරිපාටිය අනුව අධ්‍යයන කාර්ය **මණ්ඩල සංඛ්‍යාවන් නිශ්චිතවම සඳහන් කල නොහැකි අතර සියලු තනතුරු එකම බන්ඩයක් සේ සලකා වාර්ෂිකව සිදුකරන උසස්වීම් අනුව මෙම මහාචාර්ය තනතුරු ප්‍රමාණය වැඩිවී ඇති අතර අනුමත** අධ්‍යයන කාර්ය **මණ්ඩල සංඛ්‍යාවන් ඉක්මවා නොයන බව දන්වමි. තවද** වැටුප් තත්වයන් හා වෙනත් සේවා පහසුකම් අවම වීම මත අධ්‍යයන තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් නොමැති වීමද නව කාර්ය මණ්ඩල බදවා ගැනීම් වලට ඉමහත් බාදවක් වී ඇත. එසේ වුවද මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 149 ක් පමණ බවද දන්වමි.

(ආ) අනෙකුත් කාර්ය මණ්ඩල

ස්ථාන මාරුවීම් ලැබීම, උසස්වීම් ලැබීම, නව තනතුරු ඇතිවීම ආදිය මත ඇතිවන පුරප්පාඩු අවශ්‍ය අනුමතිය මත පිරවීමට කටයුතු කරන අතර දැනට ඇති පුරප්පාඩු 80 ක් පමණ බවද දන්වමි.

5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

I මෙම Msc / PG Dip. in Remote Sensing and Geographic Information System පාඨමාලාව සඳහා පීඨයේ නිර්දේශය සනාතන සභාවේ අනුමැතිය 2007 වර්ෂයේ ලබාගන්නා ලදී. මෙම පාඨමාලාව සම්බන්ධීකාරකවරයා ජාතික අවශ්‍යතාවයක් සඳහා 2007 වර්ෂයෙහි විශ්වවිද්‍යාලය මගින් නිදහස් කරන ලදී. ඔහු 2013 වර්ෂයේ නැවත සේවයට පැමිණි පසු පාඨමාලාව ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාවේ අනුමැතිය අවශ්‍ය වු අතර, ඒ අනුව කටයුතු කිරීමේදී විශ්වවිද්‍යාලයේ උපාධි අතුරු ව්‍යවස්ථා වෙනස්ව තිබූ බැවින් නැවත සංශෝධන සහිතව පීඨ මණ්ඩලයට සහ සනාතන සභාවට යැවීමට කටයුතු කරමින් පවතී.

ii මෙම Mining and Minerals Process Engineering විෂය ධාරාව සඳහා පාඨමාලාව පටන් ගැනීමේදී පෙර කරන ලද දීර්ඝ අධ්‍යයනයකින් පෙනී යන ලදුව පාඨමාලාව සුළු වශයෙන් සංශෝධන සහිතව Mining and Minerals exploration නමින් පැවැත්වීම සුදුසු බවට තීරණය කරනු ලැබ අවශ්‍ය සියළුම අනුමත කිරීම් සහිතව මෙම පාඨමාලාව 2013 ජුලි මාස 05 වන දින ආරම්භ කරන ලදී.

iii MBA in Telecommunication පාඨමාලාව ආරම්භ කිරීම සමබන්ධව විදුලි සංදේශන කෙෂත්‍රයේ ඇතිව තිබු බාධක හේතුවෙන් මෙම M.Sc in Telecommunication Management පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු යොදන ලදී. ඒ අනුව මෙම පාඨමාලාව සම්බන්ධව ලැබුන ප්‍රතිචාර මත දැනට පවත්වන M.Sc in Telecommunication පාඨමාලාවට අදාල විෂයයන් සංශෝධනය කිරීමෙන් හා M.Sc in Telecommunication Management පාඨමාලාවට අදාල නව විෂයයන් ඇතුලත් කිරීමෙන් සමාන කරන ලදුව පවත්වාගෙන යනු ලැබේ.

iv මෙම MBA in Apperal Marketing and Merchandizing පාඨමාලාව පටන් ගැනීමට පෙර කරන ලද දීර්ඝ අධ්‍යයනයකින් පෙනී යන ලද පරිදි ඇගලුම් ව්‍යාපාර කෙෂත්‍රයෙහි හැසිරීම හා එයට ඇති විවිධ ගැටලු හා තර්ජන අනුව පාඨමාලාවට ඇති ඉල්ලුම පිළිබඳ ඇති අවිනිශ්චිතභාවය හේතුවෙන් මෙම පාඨමාලාව ඇරම්භ නොකරන ලදී. ඉදිරියේදී මේ පිළිබද අධ්‍යයනයකින් පසු නැවත ආරම්භ කිරීම සම්බන්ධව සලකා බලනු ලැබේ.

## 5.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී නොවැළැක්විය හැකි හේතුන් නිසා අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට නොහැකි වූ බැවින් අපේක්ෂිත විගණන වැඩසටහන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් තිබුණි. කෙසේ වුවත් අභ්‍යන්තර විගණන වැඩසටහනේ විෂයයන් 22 න් විෂයයන් 13 ක් වර්ෂය තුළදී සම්පූර්ණ කොට ඇත. මේ වන විට සියළු පුරප්පාඩු සම්පූර්ණ කර ඇති නිසා වාර්ෂික විගණන වැඩසටහනේ පරිදි නියමිත විගණනයන් සාර්ථක ලෙස කරගෙන යනු ලැබේ.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 වර්ෂයේ සංශෝධිත වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා 2013.07.04 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

## 6 පද්ධති හා පාලන

අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කිරීම, උපදේශන නිකුත් කිරීම, පුහුණු වැඩසටහන් මගින් කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම, පසුගිය ක්‍රියාකාරකම් නැවත සමාලෝචනය කිරීම ආදිය මගින් පද්ධති හා පාලන අඩුපාඩු ඇති නොවීමට කටයුතු යොදා ඇත.

අත්සන් කලේ.

මහාචාර්ය ඒ.කේ.ඩබ්ලිව්.ජයවර්ධන
උපකුලපති.

## 24.8 ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්යසාධනය – 2012

**1** **ව්‍යවසායේ නම සහ ලිපිනය - මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව**

**2** **මෙහෙවර** - පහත දේ වලින් ආසියාවේ තාක්ෂණික සහ අදාළ අනුගාමී ශාස්ත්‍රවල ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය වීම:

- ➢ අභියෝගයන්ගේ විවිධත්වයක් සඳහා විමසුම් මනස සහ කුසලතා සංවර්ධනය පෝෂණය කරන ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීම;
- ➢ දැනුම පිළිබඳ සීමා මායිම් ව්‍යාප්ත කිරීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කරගෙන යාම;
- ➢ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමෙන් සහ තාක්ෂණ හුවමාරුවට පහසුකම් සැලසීම;
- ➢ අන්තර්ජාතිකව ස්ථානගත වූ ජාතික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්ත සහ සමාජයට විශේෂඥ සේවා සැපයීම; සහ
- ➢ ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සංවර්ධනයට දායක වීම.

**3** **ප්‍රධාන ක්‍රියාකාරකම්** -ඉගැන්වීම, පර්යේෂණ, උපදේශනය සහ ඉංජිනේරු විද්‍යාවේ, වාස්තු විද්‍යාවේ, තොරතුරු තාක්ෂණයේ වෙනත් වෘත්තීය ක්‍රියාකාරකම්.

**4** **කාර්යසාධන නැඹුරුව**

| අංකය | විස්තරය | ඒකකය | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|
| | **ආදායම සහ වියදම** | | | | | | |
| 1 | රජයේ ප්‍රදාන - පුනරාවර්තන | රුපි.'000 | 660,000 | 717,900 | 773,200 | 875,881 | 945,205 |
| 2 | හිමිකම් ආදායම- පුනරාවර්තන | රුපි.'000 | 9,533 | 10,466 | 11,405 | 18,221 | 24,981 |
| 3 | වෙනත් පුනරාවර්තන ප්‍රදාන (මහපොළ සහ ශිෂ්‍යාධාර ආදිය) | රුපි.'000 | 24,471 | 19,531 | 17,771 | 15,368 | 8,958 |
| 4 | මුලු ආදායම- පුනරාවර්තන (1+2+3) | රුපි.'000 | **694,004** | **747,897** | **802,376** | **909,470** | **979,144** |
| 5 | මුලු සේවා පිරිවැය | රුපි.'000 | 464,522 | 513,557 | 531,797 | 617,004 | 687,158 |
| 6 | වෙනත් පුනරාවර්තන වියදම් (ක්ෂය බැහැරව) | රුපි.'000 | 249,879 | 289,074 | 278,829 | 294,102 | 313,154 |
| 7 | අතිරික්තය / හිඟය {3-(4+5)} | රුපි.'000 | **(20,397)** | **(54,734)** | **(8,250)** | **(1,636)** | **(21,168)** |
| 8 | රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන (2012 භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ ඇතුළුව) | රුපි.'000 | 304,000 | 182,000 | 168,000 | 252,478 | 269,146 |
| 9 | වෙනත් ප්‍රදාන – ප්‍රාග්ධන වියදම | රුපි.'000 | 45,922 | 44,870 | - | 20,439 | 17,952 |
| 10 | උපයන ලද අරමුදල – ප්‍රාග්ධන වියදම | රුපි.'000 | 34,682 | 13,867 | 15,570 | 23,791 | 23,791 |
| 11 | ප්‍රාග්ධන වියදම - රජයේ ප්‍රධාන | රුපි.'000 | 304,000 | 182,000 | 168,000 | 262,321 | 269,146 |
| 12 | පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වලින් ලැබීම් | රුපි.'000 | 188,952 | 201,190 | 243,301 | 261,015 | 234,953 |
| 13 | පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් මත වියදම | රුපි.'000 | 148,876 | 122,921 | 203,841 | 231,307 | 241,199 |
| | **වත්කම් සහ වගකීම්** | | | | | | |
| 14 | ආයෝජන | රුපි.'000 | 38,164 | 70,018 | 143,289 | 343,018 | 334,593 |
| 15 | ජංගම නොවන වත්කම් | රුපි.'000 | 1,816,588 | 1,896,148 | 1,920,955 | 2,077,375 | 2,251,544 |
| 16 | ජංගම වත්කම් | රුපි.'000 | 134,011 | 154,210 | 195,326 | 264,805 | 238,864 |
| 17 | ජංගම වගකීම් | රුපි.'000 | 260,339 | 297,278 | 368,990 | 414,807 | 502,958 |
| 18 | ජංගම - නොවන වගකීම් | රුපි.'000 | 125,396 | 194,245 | 240,174 | 350,120 | 373,030 |
| 19 | පරිත්‍යාග/විදේශ ආධාර (සමුච්ඡිත) | රුපි.'000 | 892,167 | 898,804 | 917,858 | 972,338 | 1,059,786 |
| 20 | සමුච්චිත අරමුදල | රුපි.'000 | 710,860 | 730,050 | 732,548 | 947,933 | 889,227 |
| 21 | සේවක සංඛ්‍යාව -අධ්‍යයන | (ගණන) | 399 | 375 | 388 | 400 | 434 |
| 22 | මුලු සේවක සංඛ්‍යාව | (ගණන) | 872 | 975 | 1,009 | 993 | 1005 |
| 23 | ශිෂ්‍ය සංඛ්‍යාව | (ගණන) | 4,285 | 4,740 | 5,504 | 4,745 | 4,887 |
| | **ප්‍රමුඛ කාර්යසාධන දර්ශක** | | | | | | |
| i | මුලු ආදායමට හිමිකම් ආදායම | % | 1.37 | 1.40 | 1.42 | 2.00 | 2.55 |
| ii | සේවකයකුට මුලු සේවා පිරිවැය | රුපි.'000 | 533 | 527 | 527 | 621 | 684 |
| iii | සේවකයකුට මුලු සේවා පිරිවැය | රුපි.'000 | 108 | 108 | 97 | 130 | 141 |
| iv | ශිෂ්‍යයකුට/වර්ෂයකට පුනරාවර්තන ප්‍රදාන | රුපි.'000 | 162 | 158 | 146 | 192 | 200 |
| V | උපාධි අපේක්ෂකුට මුලු පිරිවැය | රුපි.'000 | 503 | 565 | 599 | 657 | 696 |
| vi | රැකියාවක යෙදවිය හැකි බව (මාස තුනක් ඇතුලත ප්‍රතිඵල) | % | 97 | 95 | 95 | 96 | 98 |
| vii | සේවකයකුට ශිෂ්‍යයන් | (ගණන) | 5:01 | 5:01 | 5:01 | 5:01 | 5:01 |
| viii | අධ්‍යයන කාර්යමණ්ඩල සේවකයකුට ශිෂ්‍යයන් (සත්‍ය) | (ගණන) | 11:01 | 13:01 | 14:01 | 12:01 | 11:01 |
| ix | වාහනයකට ශිෂ්‍යයන් | (ගණන) | 178.01 | 180.01 | 190:01 | 164:01 | 160:01 |